ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,520 - 2007 ඔක්තෝබර් 19 වැනි සිකුරාදා - 2007.10.19

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

	පිටුව
ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ...	—
ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ...	948
අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය	952
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය	—
අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය	—
වෙනත් පත්කිරීම් ආදිය	—
රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය	—
ආණ්ඩුවේ නිවේදන	953
මිළ පාලන දැන්වීම්	—
ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්	—
ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන	—
ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා	954
විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්	963
නැවියන්ට දැන්වීම්	—
සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම්	—

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ඔක්තෝබර් මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ඔක්තෝබර් මස 12 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

ලක්ෂමන් ගුණවර්ධන,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 422

ජාතික ශිෂ්‍ය භට බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

2007 මාර්තු මස 01 වෙනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :

නි/4161 කපිතන් එම්ඩබ්එස් සිසිරකුමාර
නි/4174 කපිතන් එස්අයිපී ද සොයිසා (ගැ)
නි/4280 කපිතන් ඩබ්කේපීඑන් ගුණසේකර
නි/4285 කපිතන් එස්එම් උපාලි බණ්ඩාර
නි/4301 කපිතන් ජීජීඑන් සමරසිංහ
නි/4353 කපිතන් ඩබ්වී අනුරුද්ධිකා (ගැ)
නි/4512 කපිතන් අයිඑම්කේ ඉලංගන්තිලක
නි/4539 කපිතන් ආර්. ඒ. එල්. එස්. ප්‍රියදර්ශන
නි/4546 කපිතන් කේ. ඒ. ඩබ්. කොඩිසිංහ
නි/4568 කපිතන් ආර්ආර්ඩීඑස් කරුණාතිලක (ගැ)

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

කොළඹ දී ය.

10-518

2007 අංක 428

ඩී/ආර්එfප්/824/එන්වයි/03/02.

ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2007 ජනවාරි මස 01 වැනි දින සිට තාවකාලික කපිතාන් වශයෙන් :

කොමාණ්ඩර් (සංඥා) නිලන්ත හීනටිගල, ආර්ඩබ්පී, ශ්‍රීලංනාහ- එන්ආර්එක්ස් 0323
කොමාණ්ඩර් (අවි) උස්හෙට්ටිගේ සුජීව රුවන් පෙරේරා, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0321
කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) වැව්ටවිදානලාගේ දොන් අර්නස්ට් මෙරිල් සුදර්ශණ, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0320
කොමාණ්ඩර් (මාලිමා) දොන් සමරසිංහ ආරච්චිලාගේ අජිත් පාලිත සමරසිංහ, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0470
කොමාණ්ඩර් (මාලිමා) කාශ්‍යප ගෝඨාභය පෝල්, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් -0465
කොමාණ්ඩර් (අවි) ආනන්ද කුමාර ගුරුගේ, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0468

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජුලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

10-675

2007 අංක 423

DIRF/RECT/86(x) AY.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරිනිය 2006 ජුලි මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවෙනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුලත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/56190 කෙඩෙට් නිලධාරිනි කවිතා හර්ෂනී පතිරාජ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

10-512

2007 අංක 421

ඩීආර්එfප්/ආර්ඊසීටී/815/හමුදාපති/පොදු.

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් විශ්‍රාමික ත්‍රිවිධ හමුදාධිපතිවරුන් 2007.10.01 දින සිට ඔවුන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

යුද හමුදාව

1. ලුතිනන් ජනරාල් ජේ. ඊ. ඩී. පෙරේරා වීඑස්වී, පීඑස්සී, එන්ඩීසී, එෆ්බීඅයිඑම් ජෙනරාල්
2. ලුතිනන් ජෙනරාල් ජී. ඩී. ජී. එන්. සෙනෙවිරත්න වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී ජෙනරාල්

නාවික හමුදාව

3. රියර් අද්මිරාල් ඩී. බී. ගුණසේකර එන්ඩීසී, පීඑස්සී අද්මිරාල්
4. රියර් අද්මිරාල් ඒ. ඩබ්. එච්. පෙරේරා වීඑස්වී, එන්ඩීසී, පීඑස්සී අද්මිරාල්

ගුවන් හමුදාව

5. එයාර් වයිෂ් මාර්ෂල් පී. එච්. මෙන්ඩිස් එම්බීඅයිඑම්, අයිඩීසී, පීඑස්සී එයාර් චීප් මාර්ෂල්
6. එයාර් වයිස් මාර්ෂල් ඩබ්. ඩී. එච්. එස්. ඩබ්. ගුණතිලක එන්ඩීසී, පීඑස්සී එයාර් චීප් මාර්ෂල්
7. එයාර් වයිස් මාර්ෂල් ඩී. සී. පෙරේරා වීඑස්වී, එන්ඩීසී, පීඑස්සී එයාර් චීප් මාර්ෂල්
8. එයාර් මාර්ෂල් ඕ. එම්. රණසිංහ ආර්ඩබ්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී එයාර් චීප් මාර්ෂල්
9. එයාර් මාර්ෂල් ජේ. වීරක්කොඩි ආර්ඩබ්පී, විඑස්වී. යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී එයාර් චීප් මාර්ෂල්

ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 සැප්තැම්බර් මස 19 වන දින,
කොළඹ දීය.

10-517

2007 අංක 425

DRF/RECT/997/AY.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම් හා ඇතුළත් කිරීම්

පහත නම් සඳහන් මහත්ම මහත්මීන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට පහත ජොෂ්ඨතා පිළිවෙලට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ තාවකාලික ලුතිනන් කර්නල්, තාවකාලික මේජර්, තාවකාලික කපිතන් සහ ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම හා එදිනම සිට ඉංජිනේරු සේවා බළකාය වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

අ. *තාවකාලික ලුතිනන් කර්නල්*

(1) ආනන්ද රණසිංහ මහතා - 2006.05.22

ආ. *තාවකාලික මේජර්*

(1) මලිගස්පේ කෝරළගේ රාජිත ප්‍රභාෂිනී නානායක්කාර මහත්මිය- 2006.05.22

ඇ. තාවකාලික කපිතන්

(1) දාසින් ගෙදර විජිත හර්සින් කුමාර බණ්ඩාර මහතා - 2006.04.05
(2) හන්දාරි දේව නයනජිත් කෝෂල ජිනසේන මහතා - 2006.04.05
(3) වැලිගමගේ උමේෂ් ෂාලුත කරුණාරත්න මහතා - 2006.04.05
(4) මාවනාන හෙට්ටිගේ සමන්ත ඉන්දික මහතා - 2006.04.05
(5) ජයසේකර කරුණානායක මුදියන්සේලාගේ රන්ජන කුමාර රණසිංහ මහතා - 2006.04.05
(6) අබේවික්‍රම බටගොඩගේ සුමිත් මහතා - 2006.04.05
(7) උරස්ස වත්තගේ ප්‍රියන්ත කුමාර මහතා - 2006.04.05
(8) රසිකා ප්‍රියදර්ශනි හේරත් මහත්මිය - 2006.04.05
(9) විජයවර්ධනගේ නිශාන්ත මන්ජුල මහතා - 2006.04.05
(10) පටබැඳිගේ සුමුදු ප්‍රසන්න බන්දුසේන මහතා - 2006.04.17
(11) සීක්කු බදුගේ තිලන්ක ප්‍රදීප් ද සිල්වා මහතා - 2006.05.03
(12) කරුණානායක මුදියන්සේලාගේ මෙලන් ප්‍රදීප් බණ්ඩාර කරුණානායක මහතා - 2006.05.03
(13) පැල්පොල ලොකුලියනගේ කළ්‍යාණි ප්‍රියංගිකා අල්විස් මහත්මිය- 2006.02.22
(14) නාරංගොඩ ලේකම්ලාගේ වෙසිල් දිනේෂ් නාරංගොඩ මහතා- 2006.05.22

ඇ. ලුතිනන්

(1) දුමින්ද වජිර කුමාර කුලරත්න මහතා - 2006.04.05
(2) අලවත්තගේ කපිල දිල්රුක් මහතා - 2006.04.05
(3) ඉන්ද්‍රා රන්ජනී කුකුලු කෝරලේ මහත්මිය - 2006.05.22

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

10-510

2007 අංක 426

DIVF/RECT/45/AY.

ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාව

අතිගරු ජනාධිපතිඋතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ පහත නම් සඳහන් බලලත් නිලධාරීන් 2006 ජූලි මස 22 වැනි දින සිට දක්වා ඇති ජොෂ්ඨතා පිළිවෙලට අනුව ලුතිනන් (උපකරණ පාලක) (පොදු රාජකාරි) වශයෙන් අධිකාරියට පත්කිරීමට හා නම් ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තු/බලකා වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) බලලත් නිලධාරි II මාරසිංහ පේඩිගේ සිරිල් මාරසිංහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ආ) බලලත් නිලධාරි II විජයමුනි දූරගේ සිරිවර්ධන ගැමුණු හේවා බළඇණිය (ස්වේච්ඡා)
(ඇ) බලලත් නිලධාරි II උඩවෙල කවිගලේ ගෙදර අබේසේකර වීරසිංහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඈ) බලලත් නිලධාරි II යාපා මුදියන්සේලාගේ මහින්ද සේනාරත්න විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඉ) බලලත් නිලධාරි II රුවුලදොල ආරච්චිලාගේ අමරරත්න ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව (ස්වේච්ඡා)
(ඊ) බලලත් නිලධාරි II නිරිඇල්ලගේ කුමාරසිංහ නිරිඇල්ල ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(උ) බලලත් නිලධාරි II කැදන්ගමුවේ ගෙදර අශෝක කරුණාජීව ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඌ) බලලත් නිලධාරි II වර්ණකුලසූරිය මහලේකම්ගේ ජෝර්ජ් එමානුවෙල් ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(එ) බලලත් නිලධාරි II අත්තනායක මුදියන්සේලාගේ සිරිපාල ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(ඒ) බලලත් නිලධාරි II රාජගුරු මුදියන්සේලාගේ රණසිංහ විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඔ) බලලත් නිලධාරි II විධානේ ගෙදර පියසිරි බණ්ඩාර ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(ඕ) බලලත් නිලධාරි II තෙන්නකෝන් මුදියන්සේලාගේ තිලකරත්න විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ක) බලලත් නිලධාරි II දිසානායක මුදියන්සේලාගේ විජේරත්න බණ්ඩා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(ග) බලලත් නිලධාරි II රාජමන්ත්‍රී ගෙදර උපුල් වසන්ත කුමාර ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය (ස්වේච්ඡා)
(ජ) බලලත් නිලධාරි II නවරත්න වීරසිංහ මුදියන්සේලාගේ ධර්මදාස ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ට) බලලත් නිලධාරි II සිරාලගේ විමලදාස විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඩ) බලලත් නිලධාරි II කාරියවසම් සිංගප්පුලි තන්තිරිගේ ප්‍රදීප් කපිල කුමාර විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ණ) බලලත් නිලධාරි II රන්හොටි බණ්ඩාරලාගේ රත්නායක ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(ත) බලලත් නිලධාරි II මේස්ත්‍රි වර්නියෙල් සිල්වා ශ්‍රී ලංකා යුද හමුදා පුරෝගාමී බලකාය
(ද) බලලත් නිලධාරි II රත්නතිලක මුදියන්සේලාගේ සුනිල් ජයසේකර බණ්ඩාර ශ්‍රී ලංකා යුද හමුදා යුධෝපකරණ බලකාය
(න) බලලත් නිලධාරි II මුතුබණ්ඩාගේ අනුර දිසානායක ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(ප) බලලත් නිලධාරි II නංභාමිගේ ප්‍රේමතිලක ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(බ) බලලත් නිලධාරි II රාජවර්ධන ගෙදර ප්‍රේමසිරි ශ්‍රී ලංකා පාබල හමුදාව (ස්වේච්ඡා)
(ම) බලලත් නිලධාරි II අත්තනායක මුදියන්සේලාගේ ලක්ෂ්මන් අත්තනායක ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(ය) බලලත් නිලධාරි II හේවාවසම් සරුක්කාලිගේ සිල්වා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(ර) බලලත් නිලධාරි II දිවාකර මුදියන්සේලාගේ තිලක් වසන්ත දිවාකර ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(ල) බලලත් නිලධාරි II යක්දෙහිගේ ප්‍රේමතිලක ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ව) බලලත් නිලධාරි II මොහොට්ටලාගේ බස්නායක සුද්දහාමි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(ස) බලලත් නිලධාරි II බඩතුරුගේ විමලසේන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(හ) බලලත් නිලධාරි II වන්නිනායක මුදියන්සේලාගේ රංජිත් වන්නිනායක ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(ළ) බලලත් නිලධාරි II කිරිබණ්ඩාගේ දිවාකර රත්නායක ශ්‍රී ලංකා පාබල හමුදාව (ස්වේච්ඡා)
(අඅ) බලලත් නිලධාරි II පුංචි නයිදේගේ උපාලි රණසිංහ ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(අආ) බලලත් නිලධාරි II ඒකනායක වැලිවේරිය වර්ධන නිමල් ඒකනායක ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය (ස්වේච්ඡා)
(අඇ) බලලත් නිලධාරි II විතාන මොහොට්ටාලගේ හේරත් බණ්ඩා ශ්‍රී ලංකා පාබල හමුදාව (ස්වේච්ඡා)
(අඈ) බලලත් නිලධාරි II ජයසූරිය ආරච්චිලාගේ සිසිර රංජිත් ජයසූරිය ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(අඉ) බලලත් නිලධාරි II හපන් පේඩිගේ රංජිත් ප්‍රේමකුමාර ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව
(අඊ) බලලත් නිලධාරි II මොරවක කෝරළගේ නිමල් කරුණාරත්න ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(අඋ) බලලත් නිලධාරි II කළුපතිරන්නැහැලාගේ රාජා රංජිත් ධර්මසිරි ශ්‍රී ලංකා යුදහමුදා සේවා බලකාය (ස්වේච්ඡා)
(අඌ) බලලත් නිලධාරි II මාදුගොඩ රාළලාගේ ලාල් පත්මසිරි ගුණරත්න ශ්‍රී ලංකා යුදහමුදා වෛද්‍ය බලකාය (ස්වේච්ඡා).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දී ය.

10–511

2007 අංක 427

DIVF/RECT/49/AY.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම් හා ඇතුළත් කිරීම්

පහත නම් සඳහන් කැඩෙට් නිලධාරීන් 2005 දෙසැම්බර් මස 17 වැනි දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා පිළිවෙලට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ දෙවන ලුතිනන් නිළයෙන් අධිකාරියට පත් කිරීම හා එදිනම සිට දක්වා ඇති රෙජිමේන්තු/බලකා වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) කෙඩෙට් නිලධාරී - තෙව්වාහන්දි ධනුෂ්ක කුමාර ද සිල්වා, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය (ස්වේච්ඡා)
(ආ) කෙඩෙට් නිලධාරී - නවීන් ප්‍රමිත දළදාවත්ත, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව (ස්වේච්ඡා)
(ඇ) කෙඩෙට් නිලධාරී - කරුණා මුණිගේ නාමල් සුමිත් සාරංග, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඈ) කෙඩෙට් නිලධාරී - රංගේ බණ්ඩාරලාගේ තරංග කුමාර වන්නිනායක, විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඉ) කෙඩෙට් නිලධාරී - උමේෂ් දිල්හාන් රත්නායක, ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)

(ඊ) කෙඩෙට් නිලධාරී - උඩගේ රාලලාගේ අමිල ධනුෂ්ක ජයවර්ධන, ගැමුණු හේවා බලඇණිය (ස්වේච්ඡා)
(උ) කෙඩෙට් නිලධාරී - උඩවත්තගේ ලසන්ත පුෂ්ප කුමාර, ශ්‍රී ලංකා යුද හමුදා යුධෝපකරණ බලකාය (ස්වේච්ඡා)
(ඌ) කෙඩෙට් නිලධාරී - පිටිගල ආචාරිගේ සුමේධ ප්‍රසාද් පිටිගල, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය (ස්වේච්ඡා)
(එ) කෙඩෙට් නිලධාරී - වර්ෂමාන දේවගේ ලලිත් දිල්ෂාන්, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ඒ) කෙඩෙට් නිලධාරී - කාංගර මුදියාන්සේලාගේ සමීර බංඩාර කාංගර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඔ) කෙඩෙට් නිලධාරී - අංජන සමන්ත විදානපතිරණ, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ඕ) කෙඩෙට් නිලධාරී - ලියනරත්නගේ මංජුල සුරංග, ගැමුණු හේවා බලඇණිය (ස්වේච්ඡා)
(ක) කෙඩෙට් නිලධාරී - කලංසූරිය ආරච්චිගේ චන්ද්‍රතිලක ජයවීර, විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ග) කෙඩෙට් නිලධාරී - දෙහිගස්පේ රණවකගේ රිෂාන් දුමින්ද රණවක, විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ජ) කෙඩෙට් නිලධාරී - උඩුවක හේවාගේ ධනුෂ්ක රොෂාන් උඩුවක, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ච) කෙඩෙට් නිලධාරී - හංගමුවේ මොහොට්ටි තරංග සම්පත්, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ට) කෙඩෙට් නිලධාරී - ගමරාලලාගේ මධුක කෞශල්‍ය ප්‍රසාද් කරුණාසේන, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ඩ) කෙඩෙට් නිලධාරී - කොම්බු හිරෝස් ඉන්දික විජේරත්න, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(න) කෙඩෙට් නිලධාරී - රණතුංගගේ දනුෂ්ක සුරේෂ් බෙනඩික් ප්‍රනාන්දු, ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

10-509

2007 අංක 424

DIRF/RECT/86(X)AY

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරිනිය 2006 දෙසැම්බර් මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවෙනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුලත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පල කරනු ලැබ තිබේ.

සී/56321 කෙඩෙට් නිලධාරිනී මහේෂිකා ප්‍රමෝද් දිල්හානි උඩුමලගල උළුවිටිගේ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

10-516

2007 අංක 429

අංකය : ඩී/ඒඑෆ්/8/I.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරියාගේ නමට ඉදිරියෙන් ඇති දින සිට තාවකාලික එයාර් කොමදෝරු නිලයට උසස් කෙරේ.

ගෲප් කැප්ටන් ප්‍රසන්න භාතිය රත්නායක (01291) නි.පො.රා. 2007.05.01

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

10-507

2007 අංක 430

අංකය : බී/ඒඑෆ්/10/ii

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික විංග් කමාන්ඩර් නිලයට උසස් කෙරේ.

ස්කොඩ්රන් ලීඩර් හේරත් ඒකනායක මුදියන්සේලාගේ ප්‍රසන්න බණ්ඩාර ඒකනායක (01698) නි.පො.රා 2005.10.05
ස්කොඩ්රන් ලීඩර් උපුල් සනත් කුමාර සේනාරත්න (01686) උපකරණ 2005.10.05
ස්කොඩ්රන් ලීඩර් වරුණ චමින්ද සේනාරත්න (01697) නි.පො.රා 2006.04.05

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

10-508

2007 අංක 431

අංක : ඩී/ඒඑප්/21/2.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට ස්ථිර ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

තාවකාලික ස්කොඩ්රන් ලීඩර් කොඩිමරක්කලගේ සුමුදු චින්තක රොද්‍රිගු, (01756) ගු. තො. නි. - 2004.05.14
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් සමන් රෙක්සි උඩුකුඹුර, (01740) උපකරණ - 2004.05.14
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් දර්ශන තුෂාර රණසිංහ, (01749) උපකරණ - 2004.08.14
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් යසංග සාරනාත් සූරියආරච්චි, (01771) උපකරණ - 2005.01.16
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් දීපාල් මුණසිංහ, (01810) උපකරණ - 2005.02.17
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් ලොකුබාලසූරියගේ හර්ෂ නන්දන ජයතිලක, (01857) උපකරණ - 2007.01.07
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් සනත් දිමුතු කලුබෝවිල, (01858) උපකරණ - 2007.01.07
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් රාජකරුණා මොහොට්ටි අප්පුහාමිලාගේ ශානක සුරේන් රාජකරුණා, (01738) උපකරණ - 2007.02.01
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් මද්දුම ආරච්චිගේ සරත් නන්දන විජේසිංහ, (01861) පරිපාලන - 2007.03.06
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් හල්ගහ විතානගේ රුවන් චන්දිම, (01864) - පාලන/රෙජි - 2007.03.23
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් ජයසිංහ ආරච්චිගේ රුවන් සිසිල් ජයසිංහ, (01867) - පාලන/රෙජි - 2007.03.23
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් බැස්ටියන් ආරච්චිගේ රවින්ද ජයසිංහ, (01869) - පාලන/රෙජි - 2007.03.23
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් තරිඳු සංජීව සේමසිංහ, (01871)-නි. පො. රා. - 2007.03.23
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් ලසන් චන්න දිසානායක, (01854)- නි. පො. රා. - 2007.04.05
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් අසංග ප්‍රභාත් ලියනආරච්චි, (01856) - මෙහෙයුම්/ගුවන් - 2007.04.19
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් මෙරගල්ගේ හේලි කොලින්ස් රූපසිංහ (01870) - පාලන/රෙජි - 2007.04.23
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් දන්කොලුවගේ දොන් ධම්මික වසන්ත කුමාර, (01873) - පරිපාලන - 2007.06.16
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් රාමජාම් රාමලිංගම්, (02107)- ගු. තො. නි. 2007.07.16

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

10-513

අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 433

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ජේ. එම්. ජේ.පී. බණ්ඩාර මහතා 2007 මැයි මස 28 දින සිට ක්‍රියාත්මකවන පරිදි නැවත නියමයක් කරනතුරු මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මහා භාරකාර වශයෙන්

10-505

2007 අංක 432

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I වන පන්තියේ ඩබ්ලිව්. ඒ. ඩී. ඒ. විජේසූරිය මහතා 2007 මැයි මස 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්,

10-506

ආණ්ඩුවේ නිවේදන

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. :-

අංකය	*ලියාපදිංචි කිරීමේ දිනය*	*විස්තරය*	*පිහිටීම*	*දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු*	*ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද*
1405	2007.09.11	යාච්ඤා ගෘහය දේවස්ථානය	උතුරු කොළඹ	පී. අයි. බී. සිල්වා දේවගැතිතුමා	ක්‍රිස්තියානි

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 11.
2007 සැප්තැම්බර් මස 27 වැනි දින.

10-572

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. :-

අංකය	*ලියාපදිංචි කිරීමේ දිනය*	*විස්තරය*	*පිහිටීම*	*දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු*	*ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද*
1406	2007.09.21	"ජීවනයේ හඬ" මොරටුවේ අපෝස්තලික දේව සභාව	මොරටුව	කේ. ජගත් ස්ටැන්ලි ෆොන්සේකා දේවගැතිතුමා	ක්‍රිස්තියානි (රෝමානු කතෝලික නොවන)

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 11.
2007 ඔක්තෝබර් මස 02 වැනි දින.

10-678

ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

යාපනය විශ්වවිද්‍යාලය

2005 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශය
(වියදම් ස්වභාවය අනුව වියදම් වර්ගීකරණය කර ඇත.)

	2005 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා රු.	*2004 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා රු.*
මෙහෙයුම් ආදායම		
පුනරාවර්තන ප්‍රදානය	391,000,000.00	288,000,000.00
වෙනත් කාර්යවලින් ශුද්ධ ආදායම / (පාඩුව)	6,961,135.89	3,443,351.76
වෙනත් ආදායම්	7,360,000.60	7,422,283.50
	405,321,136.49	298,865,635.26
	84,949,150.00	71,372,850.00
	490,270,286.49	370,238,485.26
ශිෂ්‍යයන්ට මුදල් ආධාර		
මෙහෙයුම් වියදම		
පෞද්ගලික පඩිනඩි	323,889,405.83	246,509,726.06
ගමන් වියදම්	2,692,716.68	2,288,012.54
සැපයුම් සහ භාවිත කළ පරිභෝජන	16,566,580.83	20,743,830.84
නඩත්තුව	5,824,020.89	4,892,665.83
කොන්ත්‍රාත්තු සේවා	20,033,478.39	17,633,272.92
පර්යේෂණ සහ සංවර්ධන	575,518.05	592,967.17
අගය අඩුකිරීම් සහ ක්ෂය කිරීම්	91,872,575.78	72,784,587.05
වෙනත් මෙහෙයුම් වියදම්	9,672,087.79	7,244,833.85
මුළු මෙහෙයුම් වියදම්	**471,126,384.24**	**372,689,896.26**
මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/(හිඟය)	**19,143,902.25**	**(2,451,411.00)**
ශිෂ්‍යයන්ට මූල්‍ය ආධාර	84,949,150.00	71,372,850.00
මුළු කටයුතුවලින් අතිරික්තය (හිඟය)	**(65,805,247.75)**	**(73,824,261.00)**
අතිවිශේෂ විෂයයන් (කපාහැරීම් සහ වෙනත් ගැලපීම්)	586,537.10	901,132.28
අදාළ කාලය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය) පොදු සංචිතයට මාරු කළා	**(66,391,784.85)**	**(74,725,393.28)**

නිවැරදි බවට සහතික කරන ලදී.

මහාචාර්ය එස්. මෝහන්දාස්,
ගණක නිලධාරී,
උප කුලපති.

කේ. කනගරත්නම්,
මූල්‍යාධිකාරී.

2006.02.20

යාපනය විශ්වවිද්‍යාලය

2005 දෙසැම්බර් 31 දින මුදල් තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	2005 දෙසැම්බර් 31 දිනට		*2004 දෙසැම්බර් 31 දිනට*	
	රු.	*රු.*	*රු.*	*රු.*
වත්කම්				
ප්‍රවර්තන නොවන වත්කම්				
දේපළ, පිරියත් හා උපකරණ	466,197,156.79	-	252,173,702.33	-
ආයෝජන (L. T.)	116,654,487.82	-	58,725,841.76	-
දැනට කෙරෙන ප්‍රාග්ධන වැඩ	200,470,031.30	783,321,675.91	211,748,796.53	522,648,340.62

	2005 දෙසැම්බර් 31 දිනට		2004 දෙසැම්බර් 31 දිනට	
	රු.	රු.	රු.	රු.
ප්‍රවර්තන වත්කම්				
ඉන්වෙන්ටරි/තොග	5,734,621.78		6,471,798.39	
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්	310,932,026.52		391,199,920.49	
ආයෝජන (ST)	4,732,355.80		3,818,488.45	
මුදල් හා මුදල් සමාන දේවල්	56,332,496.05	377,731,500.15	26,678,163.64	428,168,370.97
		1,161,053,176.06		950,816,711.59
බැරකම්				
ප්‍රවර්තන බැරකම්				
ගෙවිය යුතු	26,479,474.98		22,750,367.62	
උපචිත වියදම්	3,181,890.27		2,468,077.29	
මුදල් උපයමින් පවත්වන පාඨමාලා	18,716,302.51	48,377,667.76	11,520,795.02	36,739,239.93
ප්‍රවර්තන නොවන බැරකම්				
ගෙවිය යුතු	3,414,334.24		3,027,969.09	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	86,400,033.59		83,387,838.71	
සීමිත අරමුදල්	146,910,334.10	236,724,701.93	77,268,623.82	163,684,431.62
මුළු බැරකම්		285,102,369.69		200,423,671.55
මුළු ශුද්ධ වත්කම්		875,950,806.37		750,393,040.04
ශුද්ධ වත්කම්/කොටස්				
සමුච්චිත අරමුදල් (ප්‍රාග්ධන ප්‍රදාන)	1,421,865,173.45		1,237,954,256.40	
සංචිත				
පොදු සංචිතය	(654,187,177.23)		(580,557,543.63)	
බැඳුම්කර බැඳීම් සංචිත	108,214,950.15		92,938,467.27	
ප්‍රාග්ධන සංචිත	57,860.00	875,950,806.37	57,860.00	750,393,040.04
මුළු ශුද්ධ වත්කම්/කොටස්		875,950,806.37		750,393,040.04
මුළු බැරකම්		285,102,369.69		200,423,671.55
මුළු බැරකම් සහ කොටස් (යොදාගත් මුළු අරමුදල)		1,161,053,176.06		950,816,711.59

නිවැරදි බවට සහතික කරන ලදී.

මහාචාර්ය එස්. මෝහන්දාස්,
ගණක නිලධාරි,
උප කුලපති.

කේ. කනගරත්නම්,
මූල්‍යාධිකාරී.

2006.02.20.

උප කුලපති,
යාපනය විශ්වවිද්‍යාලය.

යාපනය විශ්වවිද්‍යාලයේ 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යාපනය විශ්වවිද්‍යාලයේ 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ. මුදල් පනතේ 13 (7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2006 මැයි 19 දින විශ්වවිද්‍යාලයේ උප කුලපති වෙත ඉදිරිපත් කරන ලදී.

1:2 විගණන විෂය පථය

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනිකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශ වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. ගිණුම්

2.1 *විගණන මතය*

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව මාගේ වාර්තාවේ 2:2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ මූල්‍ය ප්‍රකාශයන්හි දී ඇති සටහන් වල (අංක 2) දක්වා ඇති පරිදි වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කොට ඉදිරිපත් කර ඇති බවත් එමගින් 2005 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල සහ මුදල් ප්‍රවාහයෙහි සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කෙරෙන බවත්ය.

2:2 *ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්*

2:2:1 *ගණකාධිකරණ අඩුපාඩු*

වියදම රු. 25,018,388 කට අදාළ ගනුදෙනු නියැදියක් පදනම් කරගෙන කරන ලද විගණන සෝදිසි පරීක්ෂණයක දී නිරීක්ෂණය වූ ගණකාධිකරණ අඩුපාඩු දහ අටක් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. එබැවින් තවදුරටත් විගණනයේ දී ආවරණය නොකරන ලද කොටස්වල එවැනි ගණකාධිකරණ අඩුපාඩු තිබීමේ හැකියාව බැහැර කළ නොහැක.

2:2:2 *ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(*අ*) එකතුව රු. 341,525,924ක් වූ ණයගැතියන් හා එකතුව රු. 29,659,510 ක් වූ ණය හිමියන් සම්බන්ධයෙන් සනාථ කිරීම් කැඳවා නොතිබුණි.

(*ආ*) එකතුව පිළිවෙලින් රු. 159,872,791ක් සහ රු. 29,659,510 වූ ණයගැතියන් සහ ණය හිමියන් සම්බන්ධයෙන් වයස් විශ්ලේෂණයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2:2:3 *විගණනය සඳහා සාක්ෂි නොමැති වීම*

රු. 1,202,689,282ක් වූ වත්කම් ද, එකතුව රු. 7,913,538ක් වූ වියදම් ද අවශ්‍ය සාක්ෂි නොමැති වීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

2:2:4 *නීති රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්*

පහත සඳහන් නීති, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ රජයේ මුදල් රෙගුලාසි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම සහ උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහය ආදියෙහි සමහර ප්‍රතිපාදනයන්ට අනුකූල නොවීම් දක්නට ලැබුණු අතර ඒ පිළිබඳව විශ්ව විද්‍යාලයේ උපකුලපති වරයා වෙත නිකුත් කරන ලද මාගේ සවිස්තරාත්මක වාර්තාවේ පෙන්වා දෙන ලදී.

(*අ*) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIV පරිච්ඡේදයේ 112, 113, 114, 115, 116, 117 සහ 118 වගන්ති සහ උප වගන්ති 19 (එච්)

(*ආ*) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය :

V පරිච්ඡේදයේ 7:6, 7:6:2, 7.8 වගන්ති
XV පරිච්ඡේදයේ 4 වගන්තිය
XX පරිච්ඡේදයේ 3:1 වගන්තිය
XXV පරිච්ඡේදයේ 2:2 (එෆ්) වගන්තිය
XXVI පරිච්ඡේදයේ 2.4 හා 5 වගන්ති
XXVII පරිච්ඡේදයේ 9:4 වගන්තිය

XXIV පරිච්ඡේදයේ 3:1 වගන්තිය
XVII පරිච්ඡේදයේ 9:1 වගන්තිය
III පරිච්ඡේදයේ 3 වගන්තිය
XXX පරිච්ඡේදයේ 1.4:1 වගන්තිය.

(ඇ) මුදල් රෙගුලාසි
අංක 103(1), 104, 109, 700(5) සහ 1646

(ඈ) භාණ්ඩාගාර චක්‍රලේඛ
1979 ජූලි 29 දිනැති අංක 828, 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364 (3) සහ 1976 ජූලි 19 දිනැති අංක 828.

(ඉ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ
1980 පෙබරවාරි අංක 63, 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 සහ 1997 ඔක්තෝබර් 17 දිනැති අංක 720.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 *මූල්‍ය සමාලෝචනය*

3:1:1 *මූල්‍ය ප්‍රතිඵල*

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 457,391,785ක ඌනතාවයක් වූ අතර පෙර වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු. 362,725,393ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුනු රු. 391,000,000 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය/රු. 66,391,785 දක්වා අඩුවී තිබුණු අතර පෙර වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 288,000,000 ක ප්‍රදාන නිසා එම වර්ෂයේ ඌනතාවය රු. 74,725,393 දක්වා අඩුවී තිබුණි.

3.1.2 *විශේෂිත අරමුදල් ක්‍රියාත්මක කිරීම* :

විශේෂිත අරමුණු සඳහා ලැබුණු ප්‍රදානයන් සහ එහි පොළිය එකතුව රු. 29,063,670ක් ඒවා ප්‍රදානය කරන ලද අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.

3.1.3 *අනාර්ථික ගනුදෙනු* :

පහත සඳහන් අනාර්ථික ගනුදෙනු නිරීක්ෂණය විය :

(අ) විශ්ව විද්‍යාලය මගින් ස්වයං මූල්‍යන පාඨමාලා 17ක් පවත්වා තිබුණි. එහෙත් ස්වයං මූල්‍යන පාඨමාලා එකක් වත් නිශ්චිත කාල සීමාව තුළදී නිමකර නොතිබුණි. 2003 වර්ෂයේ පටන් ගන්නා ලද සමහර එක් අවුරුදු කාල සීමාවක පාඨමාලා 2006 අප්‍රේල් 30 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. ඉදිරිපත් කර ඇති ගිණුම් අනුව එක් ශිෂ්‍යයකුගෙන් රු. 30,000 සිට 50,000 දක්වා පරාසයක වන රු. 12,506,573ක ගාස්තු ස්වයං මූල්‍ය පාඨමාලා සඳහා රැස් කර තිබූ අතර, විශ්ව විද්‍යාලයට අනුයුක්ත කථිකාචාර්යවරුන්ට දේශන ගාස්තු ලෙස රු. 5,545,437ක් ගෙවා තිබුණි. තවදුරටත් එක් එක් ස්වයං මූල්‍යන පාඨමාලා හදාරන ලද ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ සමත් වූ සංඛ්‍යාව සම්බන්ධයෙන් වන තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රීති සහ රෙගුලාසි වලට පටහැනිව විශ්‍රාමික කථිකාචාර්යවරුන් කාර්ය පැවරුම් පදනම මත සේවයේ යොදවාගෙන මාසික පදනම මත වැටුප් ගෙවා තිබුණි. කාර්යභාර පදනම මත පත් කරන ලද සමහර කාර්ය මණ්ඩල, සේවක අර්ථ සාධක අරමුදල සහ පාරිතෝෂික හිමිකම් සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාවල නඩු පවරා ඇති බව නිරීක්ෂණය විය. කාර්යභාර පදනම මත සේවයේ යෙදී සිටින කථිකාචාර්යවරුන්ට පාරිතෝෂිකය සහ විශ්විද්‍යාල ආර්සාධක අරමුදල් ගෙවිය යුතු බවට කම්කරු විනිශ්චය සභා විසින් තීරණයක් දී තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස එසේ කාර්යභාර පදනම මත සේවයේ යොදවා ගන්නා ලද විශ්‍රාමික කථිකාචාර්යවරුන්ට රු. 900,000 දක්වා බැඳීමකට විශ්ව විද්‍යාලය යටත් වී තිබුණි.

කථිකාචාර්යවරයෙකුගේ සේවය අවශ්‍ය වූ අවස්ථාවක දී එය බාහිර පදනම මත ලබා ගැනීම වඩා ආර්ථිකමය වන බව සහතික කරගත යුතුව ඇත.

(ඇ) විශ්ව විද්‍යාලයේ විවිධ අධ්‍යනාංශ සහ සේවා අංශ සඳහා සෘජු දුරකථන මාර්ග හැට එකක් ලබා දී තිබූ අතර, අභ්‍යන්තර දුරකථන පද්ධතිය පාවිච්චියට නොගෙන බොහොමයක් සෘජු දුරකථන මාර්ග අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා යොදා ගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රු. 1,508,236ක් දුරකථන ගාස්තු ලෙස ගෙවා තිබුණි. අභ්‍යන්තර දුරකථන පද්ධතිය සම්පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කරනු ලැබුවේ නම් දුරකථන ගාස්තු රු. 452,471ක් දක්වා අඩුකර ගත හැකිව තිබුණි.

(ඈ) විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලයට සප්ත වාර්ෂික නිවාඩු මත විදේශගමන් සඳහා අදාළ රටවල්වලට වීසා ලබා ගැනීමට පෙර ගුවන් ගමන් ගාස්තු ගෙවා තිබුණි. ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර මිල දී ගැනීමෙන් පසු යෝජිත ගමන සඳහා වීසා නිකුත් නොකිරීමේ හේතුව නිසා සමහර විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල මෙම පහසුකම අනිසි ලෙස භාවිතා කර තිබූ බව නිරීක්ෂණය විය.

3.1.4 හඳුනාගත් පාඩු

ස්ථාවර වත්කම් ගබඩා විෂයයන් සහ අයකර ගත හැකි ණය, සම්බන්ධයෙන් වූ රු. 586,537ක වටිනාකමක් සමාලෝචිත වර්ෂය තුළ දී කපා හැර තිබුණි.

3.1.5 ව්‍යාපෘති ප්‍රමාදවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) 1989 පමණ තරම් වූ කාලයක සිට ගිවිසුම් වලට එළඹ තිබූ විවිධ ව්‍යාපෘති යටතේ වූ කොන්ත්‍රාත් වැඩ 2005 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) 1999 සිට 2000 කාලය තුළ වෛද්‍ය පීඨයෙහි ශ්‍රවනාගාරයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු. 7,611,885 මුදලක් කොන්ත්‍රාත් සමාගමකට ගෙවා තිබුණි.
කෙසේ වෙතත් ඉදිකිරීම් කටයුතු මේ දක්වා නිමකර නැත. මෙම අනවශ්‍ය ප්‍රමාදය නිසා ඉදිකිරීම් පිරිවැය බරපතල ලෙස වැඩි වී ඇති අතර, ව්‍යාපෘතියේ අරමුණ ද ලඟා කරගෙන නොතිබුණි. මීට අමතරව ශ්‍රවනගාරයේ අභ්‍යන්තර සැරසිලි සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු. 6,000,000ක් සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවා තිබුණි.

(ඇ) විශ්ව විද්‍යාල ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා සෘජුව යොදාගනු ලැබූ සේවකයන්ට ගෙවන ලද වැටුප් හා වේතන වලට අමතරව රු. 2,116,555ක් අලුත්වැඩියා කටයුතු සඳහා වූ ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වියදම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට පාවිච්චි නොකරන ලද විෂයන් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය නඩත්තු ගබඩාවේ තිබිය දීත් නඩත්තුව සඳහා දෙන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වෙනත් සවිකිරීම් ශේෂයක් නොමැති බැව් සඳහන් කරමින් ගොඩනැගිලි නඩත්තු සම්බන්ධ කාර්යභාර ඉංජිනේරුවරයා වාර්තාවක් දී තිබුණි. කෙසේ නමුත් විශ්ව විද්‍යාලයේ ගොඩනැගිලි සතුටුදායක ලෙස නඩත්තු කර නොතිබුණි.

(ඈ) කෘෂිකර්ම පීඨය සඳහා විදුලි තොග සැපයුමක් ලබා ගැනීම සඳහා අත්තිකාරකමක් ලෙස රු. 2,607,050ක් 2005 දෙසැම්බර් මාසයේ දී ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවා තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය 2006 අප්‍රේල් 30 දින වන විට ද ආරම්භ කර නොතිබුණි.

(ඉ) තිරුනල්වේලි ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා ජල ටැංකියක් ඉදිකිරීම සඳහා 1989 දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අත්තිකාරම් ලෙස රු. 2,000,000ක් ගෙවා තිබුණි. කෙසේ නමුත් ජල ටැංකිය ඉදිකිරීමේ කටයුතු මෙම වාර්තාවේ දිනය වන විට ද අවසන් කර නොතිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව විස්තර හෝ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) යෝජිත ඉංජිනේරු පීඨය සඳහා පරිපාලන වියදම් වෙනුවෙන් වාර්ෂික අයවැය මගින් රු. 986,552ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ නමුත් යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයක් පිහිටුවා නොතිබුණි.

(උ) ශිෂ්‍ය මහපෙන්වීමක් නිකුත් කිරීම සඳහා එක් ශිෂ්‍යයකුගෙන් රු. 65 බැගින් ගාස්තු අයකර රු. 535,540ක මුදලක් එකතු කර තිබුණි. කෙසේ නමුත්, 2006 අප්‍රේල් 30 දින වන විට ද, ශිෂ්‍ය මහපෙන්වීම අදාළ ශිෂ්‍යයන් වෙත නිකුත් කර නොතිබුණි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 අධ්‍යයන කාර්ය මණ්ඩලයට පත් කිරීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) සාමාන්‍ය රීතියක් හැටියට විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨයකට වෙන් වෙන්ව ස්ථිර කථිකාචාර්ය තනතුරු සඳහා බඳවාගෙන තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස කථිකාචාර්යවරු කිහිපදෙනෙක් එකම අධ්‍යයන ක්ෂේත්‍රයේ යොදවාගෙන තිබුණි. විවිධ පීඨ සඳහා කාල සටහන් සකස් කිරීමේදී අනෙකුත් පීඨවල සිටින ස්ථිර කථිකාචාර්යවරුන් ගැන සලකා නොතිබුණි. වෙනත් පීඨයක් සඳහා ස්ථිර කථිකාචාර්යවරයෙකුගේ සේවය අවශ්‍ය විටක දී බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස වෙනම පත්වීමේ ලිපියක් නිකුත්කර එම සේවා සඳහා අතිරේක දේශන ගාස්තු ගෙවා තිබුණි.

(ආ) නිශ්චිත බඳවා ගැනීමේ පරිපාටියක් අනුගමනය නොකර කිහිප අවස්ථාවක දී තාවකාලික කථිකාචාර්යවරුන්, උපදේශකයන් (Tutors) සහ දේශක සහායකයින් වැනි අය අධ්‍යනාංශ ප්‍රධානීන්ගේ ඉල්ලීම මත පත්කර තිබුණි.

(ඇ) විශ්ව විද්‍යාල පද්ධතිය තුළ රැකියා බලාපොරොත්තු වන සුදුසුකම් සහිත අයට තරගකාරීව අවස්ථාව ලබා නොදී අවිධිමත් පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය සිරිතක් වී තිබුණි. පෙර වර්ෂවල ගිණුම් සම්බන්ධයෙන් වූ මාගේ වාර්තාවල ද මේ සම්බන්ධයෙන් පෙන්වා දී තිබූ නමුත් මෙම අඩුපාඩුව නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) පළමු ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු හා III ශ්‍රේණියේ උපදේශ වරයකු සේවයට නොපැමිණි වසර 13 සිට 18ක කාලයකට පසු විධිමත් අනුමැතියක් රහිතව නැවත සේවයේ පිහිටුවා සේවයට නොපැමිණි කාලය විශේෂ වැටුප් රහිත නිවාඩු ලෙස සළකා තිබුණි.

3.2.2 අධ්‍යයන කටයුතු

විවිධ පීඨවල ශිෂ්‍යයන් 5,367ක් වෙනුවෙන් දේශන පැවැත්වීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 429 දෙනෙකු සඳහා වැටුප් හා දීමනා ලෙස රු. 235,016,998ක් ගෙවා තිබුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් භාරගෙන ඇති ක්‍රියාකාරකම් වල ආර්ථික, කාර්යක්ෂම සහ

ඵලදායී බව ඇගයීමට හැකිවන පරිදි පහත සඳහන් තොරතුරු එනම්, එක් එක් පීඨය තුළ සිටින සිසුන් සංඛ්‍යාව, එක් එක් පීඨයේ එක් එක් කථිකාචාර්යවරයා පවත්වන දේශන, දේශන/ක්‍රියාකාරකම් පැය ගණන, පවත්වන ලද විභාග ගණන, සමත් වූ ශිෂ්‍යයන් ගණන ආදි වූ තොරතුරු විගණනය සඳහා ලබා දී නොතිබුණි.

3.2.3 පාඨමාලා සහ විභාග

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) විශ්ව විද්‍යාලයේ පාඨමාලා 10කට ලියාපදිංචි වී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5,367 කි. මෙම පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂය තුළ දරන ලද පුනරාවර්තන වියදම රු. 263,801,236 කි. එක් ශිෂ්‍යයකු සඳහා වර්ෂයේ සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු. 510,923 ක් විය.

(ආ) විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨ යටතේ පවත්වනු ලබන විවිධ පාඨමාලාවල විභාග පවත්වන දිනයන් හා විභාගවල ප්‍රතිඵල නිකුත් කරන ඉලක්ක දිනයන් තීරණය කර නොතිබුණි. 2004 සහ 2005 වර්ෂවල සමහර පීඨවල පවත්වනු ලැබූ විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමට සැහෙන ප්‍රමාදයක් ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. අංක 636 හා 1995 ජුලි 14 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා චක්‍රලේඛය අනුව විභාගය අවසන් වී තුන්මසක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතුය. නමුත් මාස 06 සිට 12 දක්වා කාලපරාසයක් තුළ ප්‍රතිඵල ප්‍රමාද වී තිබුණි.

3.2.4 පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා පඩි සහිත සහ පඩි රහිත නිවාඩු අනුමත කිරීම

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ :

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ 10 පරිච්ඡේදයේ 27.4 වගන්තියේ උපදෙස් සැලකිල්ලට නොගෙන අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවූ කථිකාචාර්ය වරුන්ට එක් වසරකට වැඩි කාලයක් සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණි.

(ii) පරිවාස කාලයේ සිටින කථිකාචාර්යවරුන්ට අධ්‍යයන නිවාඩු අනුමත කළ අවස්ථා දක්නට ලැබුණි.

3.3 අයවැය පාලනය

අයවැය හා සත්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බැව් දක්නට ලැබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර මාගේ විස්තරාත්මක වාර්තාව මගින් විශ්ව විද්‍යාලයේ උප කුලපති වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) සේවක කළමනාකරණය
(ආ) අයවැය
(ඇ) මිලදී ගැනීම්
(ඈ) ගබඩා
(ඉ) ණයගැතියෝ
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය
(උ) පුස්තකාල පරිපාලනය
(ඌ) අභ්‍යන්තර විගණනය

(එස්. සී. මායාදුන්නේ)
විගණකාධිපති.

විගණන මතය

යාපනය විශ්වවිද්‍යාලයේ 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) හෝ 111 වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (3), (4) සහ (7) වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව, මාගේ වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් ඇතිවන බලපෑම් හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය ප්‍රකාශයන්හී දී ඇති සටහන්වල (අංක 2) දක්වා ඇති පරිදි වූ ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත්, එමගින් 2005 දෙසැම්බර් 31 දිනට යාපනය විශ්වවිද්‍යාලයේ මූල්‍ය

තත්ත්වයෙහි සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල සහ මුදල් ප්‍රවාහයෙහි සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවත් මාගේ මතය වේ.

විගණනයේ දී උද්ගත වූ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා අමතන ලද සමදින දරන මාගේ වාර්තාවේ ඇතුළත්ව ඇත.

එස්. සී. මායාදුන්නේ,
විගණකාධිපති.

2006 ජූලි මස 07 වැනි දින,
කොළඹ 07, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දී ය.

2005 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා යාපනය විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා සම්බන්ධයෙන් යාපනය විශ්ව විද්‍යාලයේ පාලන බලධාරියාගේ නිරීක්ෂණ

2.2.2 (අ) ලැබිය යුතු මුදල්වලින් වැඩි කොටස නියෝජනය වන්නේ සේවකයන්ට ගෙවන ලද ණය මුදල්වල/අත්තිකාරම්වල ශේෂයන්ය. ගෙවිය යුතු වන ගිණුම්වලින් නියෝජනය වන්නේ ශිෂ්‍යයන්ගේ තැන්පතු සහ කාර්ය මණ්ඩලයේ ඇප තැන්පතුය. එහෙයින් තහවුරු කිරීමක් අවශ්‍ය නොවේ.

(ආ) රු. 18,95,32,301 පිළිබඳ විස්තර විගණන නිලධාරීන් විසින් ඉදිරිපත් කර නොතිබීම හේතුකොට ගෙන, මේ කාරණය ගැන අදහසක් ප්‍රකාශ කිරීම දුෂ්කරය.

සැපයුම් අත්තිකාරම් ඇතුළු සියළුම ණය/අත්තිකාරම් සඳහා ආයු විශ්ලේෂණ දී තිබේ.

2.2.3 රු. 1,21,06,02,820ක මුදල පිළිබඳ විස්තර විගණන නිලධාරීන් විසින් ඉදිරිපත් කර නැති බැවින් මේ නිරීක්ෂණය පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට නොහැකිව තිබේ.

2.2.4 විශ්ව විද්‍යාලය හැකිතාක් දුරට විශ්ව විද්‍යාල පනතේ ද ආයතන සංග්‍රහයේ ද චක්‍රලේඛ ආදියේ ද විධිවිධාන පිළිපදී.

3.1.3 (අ) 2005 වර්ෂයේ දී උපාධිධාරී අධ්‍යයන පීඨය විසින් ශිෂ්‍ය කණ්ඩායම් දහයක් සඳහා එකිනෙකට වෙනස් වූ ස්වයං ජනිත අරමුදල් සහිත පාඨමාලා පහක් පමණක් පවත්වන ලදී. (ඒවායින් සමහර පාඨමාලා දෑවුරුදු කාල පාඨමාලා වූ අතර ඇතැම් පාඨමාලා එකිනෙකට වෙනස් වූ මධ්‍යස්ථානවල පවත්වන ලදී. ප්‍රමාදයට ප්‍රධාන හේතුව වූයේ පිළිතුරු පත්‍ර දෙවෙනි වර පරීක්ෂා කිරීම, බොහෝ දෙනෙකු විශ්ව විද්‍යාලයෙන් පිටස්තර වූ පරීක්ෂකවරුන් ලවා කරවීමය. මෙයට අමතරව, විශ්ව විද්‍යාලය තුළත් එය අවටත් පැවැති තත්ත්වය ද ප්‍රමාදයට හේතු විය. දැන් අපි මෙම පාඨමාලා නියමිත කාලසීමාව තුළ නිම කිරීමට හැම ප්‍රයත්නයක් ම දරමින් සිටිමු.

උපාධිධාරී අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන පාඨමාලා ඉතා ජනප්‍රිය වන අතර ශිෂ්‍යයන්ගේ වෘත්තීය සංවර්ධනයටත් සමාජයට ඔවුන්ගේ සේවය අති ප්‍රබල අන්දමිනුත් ඉටු කිරීමට ඉවහල් වී තිබේ. විශ්ව විද්‍යාලයේ වැදගත් පරමාර්ථයක් වන එහි මෙහෙවර මුදුන් පත් කර ගැනීමේ අවස්ථාව ද මේ පාඨමාලාවලින් ඉස්මතු වී තිබේ.

උපාධිධාරී අධ්‍යයන පීඨය මෙම පන්ති පවත්වන්නේ සති අන්තයේ දී සහ වැඩ කිරීමට නියමිත වේලාවලින් පසුව ද පමණි. මේ වැඩපිළිවෙළ විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරිත්වයට කිසිදු ආකාරයකින් බාධාවක් වී නැත.

(ආ) පුවත්පත් දැන්වීම් ආදිය පළ කිරීමෙන් විශ්ව විද්‍යාලය විශාල පරිශ්‍රමයක් දැරූ නමුත් ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා නියමිත සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට යෝග්‍ය ඉල්ලුම්පත්‍ර ලැබුණේ නැත. එහෙයින් අධ්‍යාපනික වැඩසටහන් පවත්වා ගෙන යාම සඳහා විශ්‍රාම ගිය ආචාර්යවරුන් බඳවා ගැනීම සිදුවිය. විශ්ව විද්‍යාල සභාව නිර්දේශ කළ පරිදි විශ්‍රාම ගිය අය නැවත සේවයේ යොදවා ගැනීමට අනුමතිය ලබා ගැනීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අමාත්‍ය මණ්ඩල සන්දේශ යැවූ නමුත් කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. අධ්‍යයන පාඨමාලා පවත්වාගෙන යාම සඳහා මහාචාර්ය වී. ධර්මරත්නම් මහතාගේ සේවය පැවරුම් පදනම මත ලබා ගැනීමට සිදුවිය. අනතුරුව ගණිතය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ හිඟය සැලකිල්ලට ගෙන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, මහාචාර්ය වී. ධර්මරත්නම්ගේ සේවය පැවරුම් පදනම මත ලබා ගැනීම සඳහා අනුමැතිය දුන්නේය.

වාර්තාවේ 3.1.3 (අ) වගන්තියේ සඳහන් වන ආචාර්යවරුන් තිදෙනා සේවයෙහි නියුක්ත කරවා ගන්නා ලද්දේ කලින් අවුරුදුවලදී මිස 2005 දී නොවේ.

සමහර විෂයවලට සුදුසුකම් සහිත ආචාර්යවරුන් හිඟ වූ විටද සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට අයදුම්පත් නොලැබුණු විට ද, විශ්‍රාම ගිය කාර්ය මණ්ඩලය යළි සේවයේ යොදවා ගැනීම හැර වෙනත් විකල්පයක් නොවිය.

ඇතැම් අධ්‍යයන අංශවල පුරවා නොතිබුණු ජ්‍යෙෂ්ඨ තනතුරු සංඛ්‍යාවෙන් සියයට 50ටත් වැඩි සංඛ්‍යාවක් පුරප්පාඩු වී තිබුණු බැවින් පිටස්තර අය හෝ විශ්‍රාමික විශ්ව විද්‍යාලයීය ආචාර්ය මණ්ඩලය බාහිර කථිකාචාර්යවරුන් වශයෙන් බඳවා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවිය. දේශන පැවැත්වීමට අමතරව ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ව්‍යාපෘති, පැවරීම්, අඛණ්ඩ ඇගැයීම් ආදියේ දී ශිෂ්‍යන්ට සහාය වීමට ද ඔවුන්ට මාර්ගෝපදේශ ලබාදීමට ද අධීක්ෂණය කිරීමට ද ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් අවශ්‍ය වී තිබිණි. වෛද්‍ය සහ විද්‍යා පීඨවල සුදුසුකම් සහිත ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ගේ දැඩි හිඟයක් පැවැති බැවින් එහි දෙපාර්තමේන්තු කීපයකට පමණක් කොන්ත්‍රාත් පදනම මත ආචාර්යවරු පත් කරනු ලැබූහ.

ආචාර්යවරුන් පැවරුම් පදනම මත පත්කිරීමේ දී ඔවුන්ට නියමිත, වැටුප තීරණය කෙරෙන්නේ විශ්‍රාම ලබා ගත් අවස්ථාවේ ඔවුන් දැරූ තනතුරේ මූලික වැටුප වශයෙනි. මෙම පත්වීම්ලාභීනට රටේ නීතිය අනුව පාරිතෝෂික, සේ.හා. අ. සහ වි. වි. අ. අ. ලබා ගැනීමට හිමි අය නම් එම ප්‍රතිලාභ ගෙවීම් වගකීමක් වශයෙන් නොව නීත්‍යානුකූල බැඳීමක් වශයෙන් සලකනු ලැබේ.

බාහිර කථිකාචාර්යවරුන් පත්කර ගැනීම ලාභදායක වුවත් ඉහත විස්තර කරන ලද හේතු මත, කාර්ය මණ්ඩලය ඉතා අඩුවූ ඇතැම් අධ්‍යයන අංශවල අවශ්‍යතා බාහිර දේශකයන් පත් කිරීම මගින් සපුරා ගත නොහැකිය.

(ඈ) විශ්ව විද්‍යාලය කාර්යාලයීය දුරකථන සපයා ඇත්තේ ඒවාට හිමිකම් ඇති සීමාසහිත නිලධාරීන් සංඛ්‍යාවට පමණි.

දැනට පවතින ආයතනය ඇතුළත වූ දුරකථන පද්ධතිය (PABX පද්ධතිය) අවුරුදු 25 කට පමණ පෙර සවිකරන ලද්දක් බැවින් දැනට එය යල් පැනගොස් ඇති අතර නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ නැත. මෙම පද්ධතිය අලුත්වැඩියා කිරීමට විශ්ව විද්‍යාලය උත්සාහ දැරූ නමුත් එය සාර්ථක වූයේ නැත. යාපනයේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ශිල්පීය නිලධාරීන් ද මෙම පද්ධතිය පරීක්ෂා කළ නොහැකි බව වාර්තා කර ඇත.

යාපනය විශ්ව විද්‍යාලය සඳහා PABX පද්ධතියක් සපයා, සවිකොට, අත්හදා බලා ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශක සේවා ලබා ගැනීමට 2003 වර්ෂයේ දී ටෙන්ඩර් කැඳවන ලදී. ඉන්ටර්කොම් දුරකථන පහසුකම් පද්ධතිය ඇතුළු ජාල පද්ධතිය පිළිබඳව අනෙකුත් විශ්ව විද්‍යාලවලින් තොරතුරු ලබාගන්නා තෙක් පෞද්ගලික සමාගමකින් උපදෙස් ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද සන්දේශය අත්හිටුවීමට 2003.07.26 වැනි දින පවත්වන ලද විශ්ව විද්‍යාලයීය සභාවේ 277 වැනි රැස්වීමේ දී තීරණය කරන ලදී.

අන්තර් සන්නිවේදන කටයුතු සඳහා සියලුම අංශ සහ ශාඛා සම්බන්ධ කෙරෙන ජාල පද්ධතිය SIDA ව්‍යාපෘතිය යටතේ විද්‍යාපීඨය විසින් ස්ථාපනය කරනු ලැබේ. එහෙයින් මෙම ජාල පද්ධතිය ස්ථාපනය කොට අවසන් වූ පසු දුරකථන ගාස්තු අඩු කළ හැකිවනු ඇත.

(ඈ) දැනට අප රටේ පවත්නා තත්ත්වය හේතුකොට ගෙන ප්‍රවාහනය සහ සන්නිවේදනය සම්බන්ධයෙන් නිතර නිතර අවුල් සහගත තත්ත්ව මතුවේ. විදේශීය රටවලට යාමට අපේක්ෂා කරන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ ගමනාගමන වැඩපිළිවෙලවල් කෙටිකාලයක් තුළ සංවිධානය කර ගත යුතුව ඇත. කාර්ය මණ්ඩලයට මුහුණු පෑමට සිදුව ඇති දුෂ්කරතා සැලකිල්ලට ගෙන වීසා බලපත්‍ර නිකුත් කිරීමට කලින් ගුවන් සමාගම්වලට මුදල් ගෙවන ලදී. එසේ වුව ද වීසා බලපත්‍ර නිකුත් කර ඇති බව ස්ථිර වශයෙන් තහවුරු කරගත් පසුව මුදල් ගෙවීමට විශ්ව විද්‍යාලය දැන් තීරණය කර තිබේ.

3.1.5 (අ) 1989 ට පෙර ගිවිසුම් අත්සන් කරන ලද වැඩ කිසිවක් අවසන් කිරීමට ශේෂව නැත. එසේ වුව ද කලා පීඨ සංකීර්ණය සහ රාමනාදන් ලලිත කලා ආයතනය 1989 ටත් කලින් ආරම්භ කළ නමුත් තවමත් අවසන් වී නැත. මේවා අතිවිශාල ව්‍යාපෘති කර්මාන්ත නිසා අදියර වශයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරන ලදී. දැනට වැඩ අවසන් කර ඇති අදියරවල ගොඩනැගිලි පාවිච්චි කරනු ලැබේ. උතුරට ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම 1990 සිට 1996 දක්වා තහනම් කර තිබුණු හෙයින් 2002 අප්‍රේල් මස A-09 මහා මාර්ගය විවෘත කරන තෙක් තහනම් නීති බලපෑ බැවින් නිදහස් ප්‍රවාහන කටයුතු නොකළ හැකි වූ බව ද කරුණාවෙන් සැලකුව මැනවි.

ආ) රු. 76,11,885 ක මුදල ගෙවන ලද්දේ නිමහම් වැඩ, අලංකරණ වැඩ සහ තහඩු ගැසීම ආදිය ඇතුළත් නොවූ 1 වැනි අදියරේ ඉතිරි වැඩ සඳහායි. අභ්‍යන්තර අලංකරණ වැඩ සඳහා වූ ලියකියවිලි පිළියෙල කිරීම අවසන් වූ පසු අදාළ වැඩ සඳහා තුන්වරක් ටෙන්ඩර් කැඳවන ලදී. එහෙත් ඒ හැම අවස්ථාවකම සාර්ථක ටෙන්ඩර්කරුවෙකු නිර්දේශ කිරීමට විශ්වවිද්‍යාල ටෙන්ඩර් මණ්ඩලයට හැකියාවක් නොවීය. ඉන්පසු විශ්ව විද්‍යාල සභාව මෙම වැඩ කොටස ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පිරිනැමූ අතර ඔවුන්ට සම්පූර්ණ අත්තිකාරම් මුදල කල්තියා ගෙවිය යුතු විය.

(ඇ) නඩත්තු ශාඛාවේ නඩත්තු ගබඩාවක් හෝ ගබඩා භාරකරුවෙක් හෝ නැත. මුදල් ශාඛාවෙන් ලැබුණු ගබඩා භාණ්ඩ රෙජිස්ටරයක සටහන් කොට වැඩ කිරීම සඳහා නිකුත් කරන ලදී. වැඩට භාණ්ඩ නිකුත් කළ පසු ශේෂයක් අවසානයේ වසා නොතිබුණු අතර නොකඩවා වැඩ කෙරෙමින් තිබුණු බැවින් සමහර භාණ්ඩ වැඩහල තුළ තිබුණා විය හැකිය. ඇතැම් වැඩ දින ගණනාවක් එක දිගටම කෙරෙමින් තිබිණි. විගණකාධිපතිවරයා සඳහන් කර ඇති රු. 21,16,555 ක මුදල ගොඩනැගිලි/ව්‍යුහ/සේවා ආදියේ සුලු අලුත්වැඩියා සඳහා වැය වූ මුදල මිස එදිනෙදා නඩත්තු වියදම් සඳහා වැය වූ මුදල නොවේ.

(ඈ) NECORD අරමුදල් යටතේ කිලිනොච්චියේ පොන් නගරහි කෘෂිකර්ම පීඨය ඉදිකිරීම 2005 සැප්තැම්බර් මස ආරම්භ කර තිබෙන අතර නියමිත දිනයෙන් පසුව පවා අවසන් කළ නොහැකිව පවතී.

(ඉ) යාපනයේ පැවැති යුද සමාන තත්ත්වය හේතුකොට ගෙන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මේ කාර්යය අත්හිටෙව්වේය. අනතුරුව 1999 දී ළිං දෙකක් සහ පොම්පාගාරය අවසන් කරන ලදී. වතුර ටැංකියේ වැඩ ද අවසන් කර දෙන ලෙස අපි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලියා නැවත නැවත ඉල්ලා සිටියෙමු.

(ඊ) මෙම මුදල් වෙන් කිරීම් ලබා දෙන ලද්දේ යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ අනුමත සේවක සංඛ්‍යාව සඳහාය. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම ගොඩනැගිලි සඳහා මුදල් වෙන් කර දී නැත. තව ද ඉංජිනේරු පීඨයක් පිහිටුවීමට අවශ්‍ය *ගැසට් නිවේදනය* රජය විසින් නිකුත් කර නැත.

(උ) ශිෂ්‍යයන්ට මාර්ගෝපදේශ පොත් නිකුත් කිරීමට අවශ්‍ය පියවර අදාළ පීඨ විසින් දැනටමත් ගෙන තිබේ. ශිෂ්‍ය අත්පොත් බොහෝ පීඨ විසින් නිකුත් කර ඇත.

3.2.1 (අ) ස්ථිර ආචාර්ය මණ්ඩලය ස්වකීය වැටුපට අමතරව කිසිදු අමතර ගෙවීමකින් තොරව තම පීඨයේ මෙන්ම අනිකුත් පීඨවල ඉගැන්වීම් කටයුතු ද ඉටු කරමින් සිටී. ස්වකීය අංශයේ/පීඨයේ ආචාර්යවරයකුගේ ඉගැන්වීම් කටයුතුවල ප්‍රමාණය අනුමත අධ්‍යාපනික සම්මත ප්‍රමාණ ඉක්මවා යන විට තම පීඨයෙන් පිටස්තර පීඨවල හෝ අංශවල දේශන පැවැත්වීම සඳහා ඔවුන් බාහිර කථිකාචාර්යවරුන් වශයෙන් පත්කොට එම අමතර ඉගැන්වීම් වෙනුවෙන් ගෙවීම කරනු ලැබේ. එබඳු බාහිර කථිකාචාර්ය පත්වීම් කරනු ලබන්නේ අත්‍යවශ්‍ය අවස්ථාවල දී සුලු සංඛ්‍යාවක් පමණි.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සේවක සංඛ්‍යා තීරණය කරනු ලබන්නේ එක් එක් පීඨයේ අවශ්‍යතා පදනම් කරගෙන ය. තව ද "අධ්‍යයන ක්ෂේත්‍රයේ" නම එක සමාන සේ පෙනුණ ද පාඨමාලාවේ විෂය පථය සහ පාඨමාලාවේ අන්තර්ගතය එකිනෙකට වෙනස් වේ. උදාහරණයක් වශයෙන් විද්‍යා පීඨයේ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ගණිතය උගන්වනවාට වඩා වෙනස් ආකාරයකට එම විෂයයන් ඉංජිනේරු පීඨයේ ඉගැන්වෙන බව දැක්විය හැකිය.

(ආ) හැම අධ්‍යයන වර්ෂයට ආරම්භ වීමට කලින් සහකාර කථිකාචාර්ය, නිබන්ධන කථිකාචාර්ය, ප්‍රදර්ශක සහ උපදේශක යන තාවකාලික තනතුරු සඳහා නිරන්තරව අයදුම්පත් කැඳවනු ලැබේ. ඉන්පසු බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව බඳවා ගැනීම් කරනු ලැබේ.

එසේ වුව ද එසේ පත්කරනු ලැබූ පුද්ගලයකු සේවයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ සේවයෙන් ඉවත්ව ගියහොත් එසේම දැන්වීම් පළ කොට පුරප්පාඩුව පිරවීමට තරම් කාලයක් නැති වන විට, ඉතා සුලු අවස්ථා සංඛ්‍යාවක දී පමණක් පීඨාධිපතිගේ සහ අංශාධිපතිගේ ඉල්ලීම මත පත්වීම් සිදු කෙරේ. එසේ කරනුයේ නියමිත අධ්‍යයන කාලය තුළ එම පාඨමාලා නිම කළ හැකි වනු පිණිසය. (ස්වල්පයක් පමණක් වූ) එබඳු පත්වීම් සිදු කරනු ලබන්නේ ඉල්ලා අස්වූ පුද්ගලයාගේ පත්වීමෙහි ඉතිරිව පවත්නා කාලය සඳහා පමණි.

(ඇ) ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් ස්වල්ප දෙනෙකුගේ සේවය පැවරුම් (හෝ කොන්ත්‍රාත්) පදනම මත ලබා ගැනීම හැරුණු විට, තරඟ කිරීමට සුදුසුකම් ඇති වෙනත් අයට අවස්ථාවක් නොදී පත්වීම් කිසිවක් සිදු නොකරනු ලැබේ. ඇබෑර්තු වන තනතුරු සියල්ල නිවේදන මගින් ප්‍රසිද්ධියට පත් කොට, බඳවා ගැනීමේ පරිපාටියට අනුව සුදුසුකම් ඇති සියලු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ඔවුන්ගේ සුදුසුකම් නීත්‍යානුකූලව පිහිටුවනු ලබන තේරීම් මණ්ඩල ලවා අගැයීමට ලක් කෙරේ. මෙම තේරීම් මණ්ඩලවල නිර්දේශ පදනම් කරගෙන පත්වීම් සිදුකරනු ලැබේ. එමගින් සුදුසුකම් ඇති සියලු අයදුම්කරුවන්ට අවස්ථාව ලබා දීමට කටයුතු කෙරේ.

(ඈ) අංක 13/1993 සහ 1993.07.14 දින දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයෙන් අනුමත කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/1993 සහ 1993.06.04 ප්‍රකාර කාර්ය මණ්ඩල දෙකම නැවත සේවයේ පිහිටුවන ලදී.

3.2.2 ඉල්ලා ඇති තොරතුරු ඉදිරි කාලයේ ඉදිරිපත් කෙරෙනු ඇත.

3.2.3 ආ) ඇතැම් පීඨවල විභාග පවත්වනු ලබන්නේ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ය. ඇතැම් පීඨවල එක් එක් අධ්‍යයන වාරය අවසානයේ දී ය. එසේ වුව ද පළමුවන අධ්‍යයන වාරයේ විභාගවල ප්‍රතිඵල නිකුත් කරනු ලබන්නේ දෙවැනි අධ්‍යයන වාරයේ විභාග ප්‍රතිඵල සමග ය.මෙසේ කරනුයේ ඒ පීඨවල විභාග රෙගුලාසි අනුව ය. මෙසේ කරනුයේ එක් එක් අධ්‍යයන වාරයේ ප්‍රතිඵල නිකුත් කළහොත් දෙවෙනි අධ්‍යයන වාරයේ පාඨමාලා ඒකක පහෙන් දෙකක් අත්හැර දැමීමට ශිෂ්‍යයන් ක්‍රියා කිරීමට ඉඩ ඇති නිසාය. එසේ වුවද උපාධි පාඨමාලා ව්‍යුහය දැන් වෙනස් කර තිබෙන අතර අලුත් ශිෂ්‍ය කණ්ඩායම්වල ප්‍රතිඵල මාස තුනක් ඇතුළත මුදාහරිනු ලැබේ.

3.2.4 අ) සහ ආ) මෙම ඡේදවල සඳහන් කර තිබෙන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ වගන්ති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 429 හා 1990.03.02 දින දරන චක්‍රලේඛනයෙන් සංශෝධනයන් කොට තිබෙන අතර එම සංශෝධන මගින්, ආචාර්යවරුන්ට අධ්‍යයන නිවාඩු දීමේ කාලය තීරණය කිරීමේ බලය ස්වකීය අභිමතය අනුව තීරණය කිරීමට විශ්ව විද්‍යාල සභාවලට පවරා තිබේ.

3.3 අයවැය මගින් පාලනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් පියවරවල් ගෙන තිබේ :

3.4 (i) මුදල් කමිටුව සහ සභාව විසින් වාර්ෂිකව අයවැය අනුමත කරනු ලැබේ ;

(ii) වෙන්කළ මුදල් ප්‍රමාණය තුළ වියදම් කෙරෙනවාදැයි සමීක්ෂණය කිරීමට හැකි වනු පිණිස වැය ලෙජරය පරිගණකගත කර තිබේ ;

(iii) මාසික තුලනාත්මක ප්‍රකාශය (අයවැයගත මුදල - සැබෑ වියදම) මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ ;

(iv) වවුනියා මණ්ඩපයට දී තිබෙන උප අග්‍රිමය විශ්ව විද්‍යාලයේ මුදල් ශාඛාවේ වැය ලැජරයක් තබාගෙන එමගින් සමීක්ෂණය කරනු ලැබේ.

4.0 (අ) වාර්තාවේ සඳහන් කර ඇති කරුණු ගැන ප්‍රබල ක්‍රියාමාර්ගයක් යොදා පාලනය කිරීමට හැම ප්‍රයත්නයක්ම ගනු ලැබේ. පහත සඳහන් පියවරවල් දැනටමත් ගෙන තිබේ.

(අ) සැපයුම සහ ඉන්වෙන්ටරි පාලනය–

සැපයුම : මිලදී ගැනීම් සම්බන්ධයෙන් ඵලදායි ක්‍රමයක් අනුගමනය කරනු ලැබේ. අනුගමනය කෙරෙන ක්‍රියා පරිපාටි මෙසේය.

i. රු. 2,00,000 ට වැඩියෙන් වටිනා භාණ්ඩ, මිලදී ගැනීමේ කමිටුව විසින් අනුමත කරනු ලැබේ ;

(ii) භාණ්ඩයේ වටිනාකම මත මිල ගණන්/ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කරනු ලැබේ ;

(iii) අවශ්‍ය අවස්ථාවන්හි දී තාක්ෂණික අගැයුම් කමිටුවේ වාර්තාව ලබා ගැනේ ;

(iv) පාවිච්චි කරන අංශයේ සාමාජිකයන්, සැපයුම් අංශයේ නිලධාරියකු සහ අභ්‍යන්තර විගණක යන අයගෙන් සමන්විත කණ්ඩායමක් විසින් තත්ත්වය සහතික කරනු ලැබේ ;

(v) භාණ්ඩ ඉන්වෙන්ටරියේ ඇතුළත් කොට මුදල් ගෙවීමට පෙර GRN ඇති කරනු ලැබේ.

ඉන්වෙන්ටරි පාලනය

(i) ලැබීම් සහ නිකුත් කිරීම් පරිගණකගත කර තිබේ.

(ii) මාසික භාණ්ඩ විශ්ලේෂණ මගින් වියදම් ගිණුම්ගත කෙරේ ;

(iii) ගබඩා අත්තිකාරම් ගිණුම් දෙකක් වන ගබඩා අත්තිකාරම් ගිණුම (සැපයුම්) සහ ගබඩා අත්තිකාරම් ගිණුම (නඩත්තු) යන මේවා ප්‍රධාන ලෙජරයේ පවත්වාගෙන යනු ලැබේ ;

(iv) උප ගබඩා ලෙජර් වියදම් ප්‍රධාන ලෙජරයේ ගිණුම් සමඟ සසඳනු ලැබේ ;

(v) පීඨ අනුව කෙරෙන වියදම් සමීක්ෂණය කෙරේ ;

(vi) තොග ශේෂය සහ එක් එක් භාණ්ඩයේ වටිනාකම ඕනෑම වෙලාවක ලබා ගත හැකිය.

ණයගැතියෝ

(i) ණය පිළිබඳ කටයුතු පරිගණකගත කොට අයකර ගැනීම් අප්‍රමාදව කරනු ලැබේ. තුලනය සහ සැසඳීම ත්‍රෛමාසිකව කරනු ලැබේ ;

(ii) සැපයුම් අත්තිකාරම් වරින්වර සමීක්ෂණය කෙරෙන අතර ගෙවූ අත්තිකාරම් වෙනුවෙන් භාණ්ඩ ලබා ගැනීමට අප්‍රමාදව පියවර ගනු ලැබේ.

මුදල් අධ්‍යක්ෂ විසින් සම්පාදිතයි.

10-514

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්-අම්බලන්තොට ශාඛාව

කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

ටවර්ස් බිල්ඩර්ස්, වෙන්දේසි දිනය 2007.10.23 පස්වරු 1.00ට

ඉහත සඳහන් වෙන්දේසි දැන්වීම 2007.10.01 දින දිවයින පත්‍රයේ සහ 2007.09.28 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* සිංහල බසින් පළ කිරීමේදී යෝජනා සම්මුතිය සඳහා 2001.07.21 දින වශයෙන් පළ වී ඇත.

එය 2006.07.21 යනුවෙන් නිවැරදි විය යුතු බවට සියලු දෙනාට දන්වමි.

කළමනාකරු,
කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 129, තිස්ස පාර,
අම්බලන්තොට,

දුරකථන අංක : 047-2223816
: 047-2223818-9
ෆැක්ස් අංක : 047-2223816

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යොෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 99, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් 2445393

10-655

මහජන බැංකුව-ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය - ගාල්ල

වෙන්දේසිකරුගේ නම සංශෝධනය කිරීම

ගාල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයට අයත් පහත සඳහන් ශාඛාව වෙනුවෙන් පැවැත්වීමට නියමිත පහත දක්වා ඇති ණයකරුගේ දේපළ වෙන්දේසියේ වෙන්දේසිකරු එම කටයුතු වලින් ඉවත් කර පහත සඳහන් වෙන්දේසිකරු ඒ වෙනුවට පත් කිරීමට මහජන බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් 2004.10.28 දින ඒකමතිකව අනුමත කර ඇති බැව් දන්වමු.

ශාඛාව	*ණයකරු*	*පැරණි වෙන්දේසිකරුගේ නම*	*පත්කළ වෙන්දේසිකරුගේ නම*
ගාල්ල කොටුව	එම්. ඒ. කේ. ජයසේකර, වී. සී. සුදුසිංහ ඒ. සුදුසිංහ	එන්. පී. පෙරේරා	ඊ. එස්. රාමනායක මිය

ප්‍රාදේශීය කළමනාකරු,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
ගාල්ල.

10-667

වයඹ සංවර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 ජූනි මස 28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. හේවාපතිරණ විසින් සහතික කරන ලද 2005 ජනවාරි මස 12 වැනි දින අංක 5500 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කුරුණෑගල තැපැල් විල්ගොඩ පාර අංක 1/31හි පදිංචි ලංසකාර හේරත් මුදියන්සේලාගේ ඉසුරු සම්පත් ධර්මරත්න සහ කුරුණෑගල තැපැල් විල්ගොඩ පාර අංක 1/31හි පදිංචි ලංසකාර හේරත් මුදියන්සේලාගේ ධර්මරත්න ණය කරුවන් හා උකස් කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් අටලක්ෂ අසූ දෙදහස් හාරසිය පනහ (රු. 8,82,450) ක මුදල ද, එකී මුදලට 2006.06.01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් වූ පොලිය සමහ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 5500 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

ඉඩමේ උපලේඛනය

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, කුඩාගල්බඩ කෝරලේ වැලගනේ පිහිටි දැලියම්පොලේහේනය කියන ඉඩම සඳහා එස්. ටී. ගුණසේකර බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 5642 සහ 1993.03.15 වැනි දින දරන පිඹුරේ සඳහන් කැබලි අංක 03 දරන ඉඩමට මායිම්, උතුරට සහ උතුරු-බස්නාහිරට : ආතර් පෙරේරාට අයිති ඉඩම ද, නැගෙනහිරට : වැලගනේ පන්සල සිට පුත්තලම් පාරේ නුගේ හන්දියට එන ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : එකී අංක 5642 දරන පිඹුරේ කැබලි අංක 04 ද, බස්නාහිරට : එකී අංක 5642 දරන පිඹුරේ කැබලි අංක 04 ද යන මායිම් තුළ වූ රූඩ් 02ක් විශාල ඉඩම හා ඊට අයිති සියළු දේද.

02. එකී කෝරළේ, වැලගනේ පිහිටි දැලියම්පොලේහේනය දැනට වත්ත නමැති ඉඩම සඳහා ස්ටැන්ලි ටී. ගුණසේකර බලයලත් මානක නිලධාරී විසින් මැන සාදන ලද අංක 5642 සහ 1993.03.15 දින දරන පිඹුරේ කැබලි අංක 02 දරන ඉඩමට මායිම් උතුරට : එකී අංක 5642 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 01 දරන අඩි 18ක් පළල පාර ද, නැගෙනහිරට : අඩි 12ක් පළල පාර ද, දකුණට : එකී අංක 5642 දරන පිඹුරේ කැබලි අංක 05 ද, බස්නාහිරට : වැලගනේ පන්සලේ සිට පුත්තලම් පාරේ නුගේ හන්දිය දක්වා දිවෙන ප්‍රාදේශීය සභා පාර ද යන මායිම් තුළ වූ රූඩ් තුනයි පර්චස් දෙකක් (අ. 0, රූ. 3, පර්. 2) විශාල ඉඩම සහ ඊට අයත් සියළු දේත් වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1130/320, 321 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සනත් සේනාධීර,
ප්‍රධාන කළමණාකරු-අය කිරීම්,

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

10-656/1

රජරට සංවර්ධන බැංකුව-ගල්නෑව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානිත ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43(ආ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික රජරට සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන මත සම්මත කරන ලද යෝජනා සම්මුතිය

2001 ඔක්තෝබර් මස 03 දින රජරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත අනුව ඒකමතිකව පහත සඳහන් යෝජනාව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 8035.

රජරට සංවර්ධන බැංකුව නමට නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් නදී ඒ කුරේරා විසින් ලියා සහතික කරන ලද 2000 සැප්තැම්බර් 26 දිනැති අංක 539 දරන උකස් කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගල්නෑව ඉහලගම පාර යන ලිපිනයේ පදිංචි රත්නසිරි අත්තනායක ණයකරු හා උකස්කරු වශයෙන් ගෙවීම් පැහැරහැර ඇති හෙයින් එකී උකස්කරය යටතේ 2007.03.31 දිනට රජරට සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් හත්ලක්ෂ හාරදහස් හැත්තෑ හතරයි ශත හතක (රු. 704,074.07) මුදල හා එදින සිට රුපියල් දෙලක්ෂ හැටහය දහස් හයසියක (රු. 266,600) මුදල සඳහා වාර්ෂිකව සියයට විසි හයක් (26%) බැගින් විකිණීමේ දිනය දක්වා පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුන වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 539 දරණ උකස්කරය මගින් රජරට සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තරකර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම ප්‍රසිද්ධ වෙන්දේසිකරුවන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව රජරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

ඉඩම් උපලේඛනය

පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 539 මගින් උකස් කරනු ලැබුවා වූ උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නැගම්පහ කෝරලයේ, අංක 471 ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශයේ අ.ග.පි. 949 නිදිකුම්බා යාය නැමැති ගමේ පිහිටා ඇති ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (රූඩ් 02) විශාල රජයේ ඉඩම වන, උතුරට : එල්. ඒ. සිරියලතාගේ සහ එච්. කේ. එම්. මුතුමැණිකාගේ ඉඩම ද නැගෙනහිරට : එච්. කේ. මුතුමැණිකාගේ ඉඩම සහ රජයේ ඉඩම ද දකුණට : අතුරු පාර සහ රජයේ ඉඩම ද බස්නාහිරට : එල්. ඒ. සිරියලතාගේ ඉඩම සහ මාර්ග රක්ෂිතය ද. යන මෙකී මායිම් තුල පිහිටි දේපළ හා සියලු දේත් වේ.

මෙම උකස අනුරාධපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එල්. ඩී. ඕ. 154/97 පිටුවේ 2000.10.17 දින ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රත්නසිරි සිරිවර්ධන,
සාමාන්‍යාධිකාරී,

රජරට සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක, 338/18,
බැංකු පෙදෙස,
අනුරාධපුරය.

10-474/2

රජරට සංවර්ධන බැංකුව-පොලොන්නරුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානිත ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43(ආ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික රජරට සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන මත සම්මත කරන ලද යෝජනා සම්මුතිය

2006 පෙබරවාරි මස 18 දින රජරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත අනුව ඒකමතිකව පහත සඳහන් යෝජනාව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 10-06032-1.

රජරට සංවර්ධන බැංකුව නමට නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රසන්නා සරසී හරිස්චන්ද්‍ර විසින් ලියා සහතික කරන ලද 2005 අප්‍රේල් 11 දිනැති අංක 2206 දරන උකස් කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පොලොන්නරුව වැවේතැන්න අංක 02 යන ලිපිනයේ පදිංචි ජයවීර කන්කානන්ගේ සුමිත්‍රා ජයවීර ණයකරු හා උකස්කරු වශයෙන් ගෙවීම් පැහැරහැර ඇති හෙයින් එකී උකස්කරය යටතේ 2007.03.31 දිනට රජරට සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් හයලක්ෂ අනූදෙදහස් නවසිය අනූහයයි ශත හැත්තෑ එකක (රු. 692,996.71) මුදල හා එදින සිට රුපියල් හාරලක්ෂ අනූපන් දහසක (රු. 495,000) මුදල සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් විකිණීමේ දිනය දක්වා පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුන වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 2206 දරණ උකස්කරය මගින් රජරට සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තරකර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂෝක්මන් සහ සමරවික්‍රම ප්‍රසිද්ධ වෙන්දේසිකරුවන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව රජරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

ඉඩම් උපලේඛනය

පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 2206 මගින් උකස් කරනු ලැබුවා වූ උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, ලංකාපුර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, මැද හා එගොඩ පත්තුවේ 73ඊ ලක්ෂ උයන ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශයේ සේවා මුක්ත ජනපදය නැමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක අ.ජ.පි.පො.13 දරන පිඹුරේ අංක 83 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇත්තා වූද, පළවන උපලේඛණයේ සවිස්තරව දක්වා ඇති ඉඩමෙන් කොටසක් සඳහා බලයලත් මිනින්දෝරු ආර්. බී. අබේකෝන් මහතා විසින් මැන සාදනු ලද වර්ෂ 2004 ක් වූ අගෝස්තු මස 13 වන දින සහ අංක ජී 2004. 105 දරන පිඹුරෙහි ලොට් අංක 01 වශයෙන් ඉඩම් කොටසට මායිම් උතුරට : අ. ජ. පි. පො. 13 දරන පිඹුරේ ලොට් අංක 81 සහ 82 ද, නැගෙනහිරට : අ. ජ. පි. පො. 13 දරන පිඹුරේ ලොට් අංක 73 පාර ද, දකුණට : පාර ද බස්නාහිරට : අ. ජ. පි. පො. 13 දරන පිඹුරේ ලොට් අංක 83 හි ඉතිරි කොටස ද. යන මෙකී මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ. ද, රූඩ්. 2, පර්. 0) *නොහොත්* හෙක්ටයාර් බින්දුවයි දශම දෙකයි තුනක් (හෙ. 0.23) වපසරිය යුතු ගොඩ ඉඩම් කොටස සහ එහි තුල වූ සියලු දේත්වේ.

මෙම උකස පොලොන්නරුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඉ. සං. ආ. 3/5/3/101වං. හා 22/157 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රත්නසිරි සිරිවර්ධන,
සාමාන්‍යාධිකාරී.

රජරට සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක, 338/18,
බැංකු පෙදෙස,
අනුරාධපුරය.

10-474/1

වයඹ සංවර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.04.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය

කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. හේවාපතිරණ විසින් සහතික කරන ලද 2005 මාර්තු මස 10 වැනි දින අංක 5567 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම සඳහැරීම්, උඩමල්වත්ත, වැල්ලව පදිංචි ජයකොඩි ආරච්චිලාගේ මල්ලිකා ජයකොඩි හෙවත් ජයකොඩි ආරච්චිල්ලාගේ මල්ලිකා ජයකොඩි ණය කරු හා උකස් කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් දෙලක්ෂ හැත්තෑහත්දහස් අටසිය හැත්තෑ හයයි ශත දාහතක් (රු. 2,77,876.17) ක මුදල ද, එකී මුදලට 2006.05.10 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂකට සියයට දහනවය (19%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 5567 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ලි හතපත්තුවේ, මහගල්බඩ මෙගොඩ කෝරළේ, උඩමල්වත්තේ පිහිටි උඩමල්වත්තේ වැවේ කුඹුරට යාවූ හේන දැනට වත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ බලයලත් මානක නිලධාරී ආර්. ඇම්. රත්නපාල මහතා විසින් මැන සාදන ලද 2004.05.01 සහ 1268 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 02 උතුරට : ජේ. ඩී. රණතුංග හිමිකම් කියන කුඹුරට ද, නැගෙනහිරට : ජේ. ඒ. ජයරත්න හිමිකම් කියන ඉඩම ද, දකුණට : බුදනාපිටිය, වැල්ලව මහා මාර්ගයට සහ ප්‍රාදේශීය සභා පාරට ද, බස්නාහිරට : ඉහත කී අංක 1268ඒ දරන පිඹුරේ කැබලි අංක 01 ද යන මායිම් තුළ වූ රූඩ් තුනයි, පර්චස් දෙකයි දශම හතර (අ. 0, රූ. 3, පර්. 2.4)ක් විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි යනා දී සියළු දේත් වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1121/300 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සනත් සේනාධීර,
ප්‍රධාන කළමණාකරු-අය කිරීම්,

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

10-656/4

වයඹ සංවර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.02.28 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. පර්සි වඩුගෙදර විසින් සහතික කරන ලද 2002 දෙසැම්බර් මස 24 වැනි දින අංක 3917 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොස්වත්ත, තැපැල් තාරණ, උඩවෙල හි පදිංචි ලියන මුදියන්සේලාගේ විලියම් සහ කොස්වත්ත තැපැල් තාරණ උඩවෙල හි පදිංචි ලියන මුදියන්සේලාගේ උදේනි ජයවික්‍රම ණය කරුවන් හා උකස් කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් අනූතුන්දහස් එකසිය පනහ (රු. 93,150) ක මුදල ද, එකී මුදලට 2006.05.27 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂකට සියයට විසිඑක (21%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 3917 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, කිණියම කෝරළේ, කොස්වත්ත ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ කොස්වත්ත නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ඔහු බාරයේ ඇති අංක 1457 දරන පිඹුරෙහි අංක 285 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති හෙක්ටයාර් බින්දුවයි දශම දෙකයි දෙකයි බින්දුවක් (හෙක්. 0.220) විශාල කොස්වත්ත හේන්යාය නමැති ඉඩමට මායිම් උතුරට : පාර ද, නැගෙනහිරට : කැබලි අංක 286 ද, දකුණට : කැබැලි අංක 293 ද, බස්නාහිරට : කැබලි අංක 284 ද යන මායිම් තුළ පිහිටි බිම් කොටස සහ ඊට අයිති සෑම සියළු දේත් වේ.

මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී/7/138 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සනත් සේනාධීර,
ප්‍රධාන කළමණාකරු-අය කිරීම්,

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

10-656/2

වයඹ සංවර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.04.30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ලයනල් කේ. පටබැඳි විසින් සහතික කරන ලද 2004 අගෝස්තු මස 05 වැනි දින අංක 6054 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම අංක 115, තුරුලියගම, වැල්ලව හි පදිංචි ගැට්ටුවන්ගේ ෂෙල්ටන් නිමල් රත්න ණයකරු හා උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් දෙලක්ෂ හතලිස් එක් දහස් දෙසිය විසිපහයි ශත තුන (රු. 2,41,225.03) ක මුදල ද, එකී මුදලට 2007.02.09 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂකට සියයට විසිතුන (23%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 6054 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ලි හත්පත්තුවේ, මහගල්බඩ මෙගොඩ කෝරළේ, කුඩාකන්දේගම පිහිටි ගල් ඇන්දේනේ දැනට වත්ත නැමැති ඉඩමට කුරුණෑගල දිසා අධිකරණයේ පැවති අංක 4271/ බෙදුම් නඩුවට යා කර ඇති බලයලත් මිනින්දෝරු එම්. බී. කලවානේගම මහතා විසින් මැන සාදන ලද අංක 1599 සහ 2000.06.26 දිනැති පිඹුරේ නිරූපිත කැබලි අංක 01ට මායිම් උතුරට : ප්‍රේමදාස හිමිකම් කියන ඉඩමට ද, නැගෙනිරට : කැබලි අංක 03 (පාර ද) 04 සහ මල ඇල ද, දකුණට : කැබලි අංක 02 ද, බස්නාහිරට : සෙව්වාට තිබී දැනට ජේ. බී. පද්මාවතී හිමිකම් කියන ඉඩම සහ ප්‍රේමදාස හිමිකම් කියන ඉඩම ද යන මායිම් තුළ අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් හතයි දශම හතක් (අ. 1, රූ. 1, පර්. 7.7) හෙවත් හෙක්ටයාර් 0.52531ක් විශාල ඉඩම සහ ඊට අයත් ගෙවල්, ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළු දේද, එකී පිඹුරේ නිරූපිත කැබලි අංක 03 දරන පාර සහ අනිකුත් පාරවල් පොදුවේ පාවිච්චි කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතිවාසිකම් සමග ද වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1274/259 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සනත් සේනාධීර,
ප්‍රධාන කළමණාකරු-අය කිරීම්,

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

10-656/3

සී/ස හැටන් නැෂනල් බැංකුව-මාරවිල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.07.31 දින පවත්වන ලද සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. එම්. ඩී. ජයසිංහ විසින් සහතික කරන ලද්දා වූ ද සී/ස හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2005.08.30 දින සහ අංක 14656 දරණ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම බුලත්සිංහලගේ නිහාල් ක්‍රිෂාන්ත කුමාර් පෙරේරා ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ අසූදෙදහස් දෙසිය පනස්හතරයි ශත තිස්හතර (රු. 6,82,254.34) ක මුදලක් 2007.02.28 වන දින වන විට සී/ස හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 6,82,254.34 ක මුදලට 2007.03.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලියද ප්‍රචාරක වියදම් සඳහා දරණ ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 14656 දරණ උකස් බැඳුම්කර මගින් සී/ස හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය තුළ මානක්කුලම, මුන්නේස්වරම් පත්තුවේ, උතුරු පිටිගල් කෝරළේ, මාන්නක්කුලම් හි පිහිටි මාන්නක්කුලම කැලේ වත්ත නැමති ඉඩමට බලයලත් මානක එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් මැන සාදන ලද අංක 3070/බී සහ 2000 ජුනි මස 08 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන කරන ලද ලොට් 1ඒ ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද හා නිශ්චිත ඉඩම් කොටස

උතුරට : චාල්ස් සිඤ්ඤෝ හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : එම්. ආර්. වික්‍රම හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : එකී පිඹුරේ කැබලි අංක 1/බී කොටසින් ද, සහ බස්නාහිරට : මානක්කුලම සිට කොකාවිල දක්වා දිවෙන ප්‍රධාන පාරෙන්ද මායිම් වූ රුඩ් එක (අ. 0, රූ. 1,පර්. 0) ක විශාලත්වයක් සහිතව ඒ තුළ පිහිටි පස්, ගහකොළ, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුදේත් සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති)
මාණ්ඩලික ලේකම්.

10-672/3

සී/ස හැටන් නැෂනල් බැංකුව-වැල්ලවාය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.08.30 දින පවත්වන ලද සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ විසින් සහතික කරන ලද්දාවූ ද සී/ස හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද 2003.08.29 දින සහ අංක 895 සහ බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දා වූ ද සී/ස හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද 2004.08.09 දින සහ අංක 12592 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තෙන්නකෝන් මුදියන්සේලාගේ තිස්ස නිලන්ත තෙන්නකෝන් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් දෙලක්ෂ හතරදහස් හත්සිය දහඅටයි ශත තුන (රු. 2,04,718.03) ක මුදලක් 2005.10.31 වන දින වන විට සී/ස හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 2,04,718.03 ක මුදලට 2005.11.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 895 සහ 12592 දරන උකස් බැඳුම්කරයන් මගින් සී/ස හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කෝරළේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, වැල්ලවාය ප්‍රාදේශීය සභා සීමාව තුළ අනාපල්ලම, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කන්ඩියායගම ගමෙහි "අනාපල්ලමේහේන්යාය" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක බී. ජී. සී. පුෂ්පකුමාර විසින් මැන සාදන ලද අංක 2866 සහ 2003 ජූනි මස 22 වන දින දරණ පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස උතුරට : ඩී. එම්. සීතා හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : පාරක් සඳහා වෙන්කල කොටසින්ද, දකුණට : ඩබ්. එම්. පුංචිබණ්ඩා හිමිකම් කියන ඉඩමෙන් ද සහ බස්නාහිරට : ආර්. එම්. පොඩිසිඤ්ඤෝ හිමිකම් කියන ඉඩමෙන්ද මායිම් වූ අක්කර දෙක (අ. 2, රූ. 0, පර්. 0) ක විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි සහ සියළුම දේත් සමඟ ඉහතින් විස්තර කරන ලද බලයලත් මානක බී. ජී. සී. පුෂ්පකුමාර විසින් වර්ෂ 2003.06.22 වන දින පිළියෙල කරන ලද අංක 2866 දරන පිඹුරේ මාර්ග අයිතිය ද සමඟ මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ එල්.ඩී.ඕ/එම්88/244 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති)
මාණ්ඩලික ලේකම්.

10-672/1

සී/ස හැටන් නැෂනල් බැංකුව-කොල්ලුපිටිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.05.24 දින පවත්වන ලද සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ඩී. සිල්වා විසින් සී/ස හැටන් නැෂනල් බැංකුවට ලියා සහතික කරන ලද්දාවූ ද 2002.11.05 සහ 2004.09.07 දිනැති සහ පිළිවෙලින් අංක 825 සහ 1227 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජේම් නිරංජන් ගුණරත්න *නොහොත්* ජේම් නිරංජනි ගුණරත්න බෙනඩික් රොබින් ජන්සෙන් සහ ඇනී මෙලොනි ජන්සෙන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් විසිඅටලක්ෂ හැත්තෑඑක්දහස් හයසිය හැත්තෑහයයි ශත පනස්තුන (රු. 28,71,676.53) ක මුදලක් 2007.03.12 වන දින වන විට සී/ස හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 28,71,676.53 ක මුදලට 2007.03.13 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 825 සහ 1227 දරන බැඳුම්කර මගින් සී/ස හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සී/ස හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ බත්තරමුල්ල කොට්ඨාසය තුළ

දකුණු තලංගම, රොහිනා මාවත, වරිපනම් අංක 75 හි පිහිටි ජොහාරා ස්ට්‍රේට් නමින් හැඳින්වෙන ඉඩමට බලයලත් මානක ඩී. ඒ. වීරක්කොඩි විසින් මැන සාදන ලද 1993 ජූලි 27 දිනැති අංක 396 දරන පිඹුරේ බෙදා වෙන්කර විස්තර කරන ලද ලොට් 1 දරන ඉඩම ඊසානදිගට : වරිපනම් අංක 71, රොහිනා මාවතෙන්ද, ගිණිකොණ දිසාවට : පාරෙන්ද (රොහිනා මාවත), නිරිතදිගට : පාරෙන්ද (රොහිනා මාවත) සහ වයඹට : පාරෙන්ද (රොහිනා මාවත) මායිම් වූ පර්චස් නමයයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.65) ක් විශාල ඇති ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති)
මණ්ඩලයේ ලේකම්.

10-672/2

සෙලාන් බැංකුව පීඑල්සී-මහනුවර ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අගෝස්තු මස 17 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0170-01733581-101

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. පරමසෝති විසින් සහතික කරන ලද 2005 දෙසැම්බර් 13 දිනැති අංක 2115 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කිරිබත්කුඹුර පදිංචි පිටියේගෙදර නිමල් ජයසිංහ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිඑක්ලක්ෂ හාරදහස් අටසිය පනස් හතරයි ශත හැත්තෑනමයක (රු. 21,04,854.79) මුදලක්, 2006 නොවැම්බර් 26 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 21,04,854.79 මුදලද, 2006 නොවැම්බර් 27 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 2115 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උගස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ උඩපලාත, නැගෙනහිර කෝරළේ කුරුගම පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඒකනායක විසින් සාදන ලද 1988.03.12 දිනැති අංක 194 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ට්‍රැෆ්පර්ඩ් හිල් එස්ටේට් නමැති ඉඩමේ කොටසක් වන කැබැලි අංක 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : කැබැලි අංක 2 සහ එච්. එස්. තෝමස් සිල්වාට හිමි ට්‍රැෆ්පර්ඩ් හිල් එස්ටේට් හි කොටස ද, නැගෙනහිරට : කැබැලි අංක 2 ද, දකුණට : අඩි පාර ද සහ බස්නාහිරට : අංක 563 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 4 ද, යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් විසිහතක් (අ. 0, රූ. 3, පර්. 27) ක් විශාල, ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍ඉරුව කේ 280/249හි ලියාපදිංචි කර ඇත.

මධ්‍යම පලාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ උඩපලාත, නැගෙනහිරට කෝරළේ කුරුගම පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඒකනායක විසින් සාදන ලද 1988.03.12 දිනැති අංක 194 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ට්‍රැෆ්පර්ඩ් හිල් එස්ටේට් නමැති ඉඩමේ කොටසක් වන කැබැලි අංක 2 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : ගම්මුත්තෑ කුඹුර සහ වනාන ද, නැගෙනහිරට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට හිමි ට්‍රැෆ්පර්ඩ් හිල් එස්ටේට් හි රබර් වගා කළ කොටස සහ අඩි පාරද, දකුණට : අඩි පාර සහ බස්නාහිරට : එකී අංක 194 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 1 ද, යන මායිම් තුළ අක්කර හතරයි පර්චස් විසිදෙකක් (අ. 4, රූ. 0, පර්. 22)ක් විශාල, ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍ඉරුව කේ 280/250, 262 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - නීති.

10-646/2

සෙලාන් බැංකුව පීඑල්සී-ඩෙවලප්මන්ට් බෑන්කිං

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අගෝස්තු මස 29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0170-01478800-101

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. පරමසෝති විසින් සහතික කරන ලද 2004 මැයි 17 දිනැති අංක 1481 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම රජවැල්ල පදිංචි ලියනරාලලාගේ අජිත් ප්‍රසන්න ධර්මසූරිය සහ මෙසස්

චන්ද්‍රසේකර රාජකරුණා අබේකෝන් වාසල බණ්ඩාරනායක මුදියන්සේ රාලහාමිලාගේ කපුවත්තේ වලව්වේ ගර්ට්රුට් කපුවත්ත යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහතුන්ලක්ෂ හතලිස්දහස් පන්සිය විස්සක (රු. 13,40,520) මුදලක්, 2006 සැප්තැම්බර් 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 13,40,520 මුදල ද, 2006 ඔක්තෝබර් 1 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1481 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩුගම්පහ කෝරළේ, කුණ්ඩසාලේ පිහිටි බලයලත් මිනින්දෝරු සෙනරත් විජේරත්න විසින් සාදන ලද 1994 ජූලි 7 දිනැති අංක 2864 දරන සැලැස්ම අනුව පල්ලේකැලේවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද යාබද කැබලි වන කැබැලි අංක 1 දරන ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම හයයි තුනක් (අ. 0, රූ. 0, පර්. 13.63), කැබලි අංක 2 ප්‍රමාණයෙන් පර්චස් පහලොවයි දශම දෙකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 15.22), කැබැලි අංක 5 ප්‍රමාණයෙන් පර්චස් පහලොවයි දශම හතරයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 15.42) සහ කැබලි අංක 7 ප්‍රමාණයෙන් පර්චස් පහලොවයි දශම දෙකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 15.22) විශාල එකතුව රූඩ් එකයි පර්චස් දහනවයයි දශම හතරයි නවයක් (අ. 0, රූ. 1, පර්. 19.49) විශාල ඉඩමට මායිම්, නැගෙනහිරට : පීපී/මහ 3298 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 6 ද, නිරිතට : එකී සැලැස්මේ සඳහන් කැබැලි අංක 3 ලකුණු කළ පාර ද, බස්නාහිරට : එකී සැලැස්මේ සඳහන් කැබැලි අංක 3 ලකුණු කළ පාර සහ වයඹට වෙන් කල ඉඩම යන මායිම් තුල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්‍රිරුව ඊ 620/181 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-646/1

සීමාසහිත සෙලාන් බැංකුව-සරික්කමුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 මැයි මස 24 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0400-06858170-001

"සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ටී. පී. කරුණාසේකර විසින් සියල්ලම සහතික කරන ලද 2000 සැප්තැම්බර් 12 දිනැති අංක 387, 2001 සැප්තැම්බර් 28 දිනැති අංක 579, 2001 නොවැම්බර් 6 දිනැති අංක 595 සහ 2003 ජූලි 28 දිනැති අංක 808 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙහිවල පදිංචි හඳපාන්ගොඩගේ හසිත චන්ද්‍රසේකර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හැත්තෑතුන්ලක්ෂ අසූඅටදහස් හාරසිය හැත්තෑ නවයයි ශත හැත්තෑ දෙකක (රු. 73,88,479.72) මුදලක්, 2006 දෙසැම්බර් 12 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 73,88,479.72 මුදලද, 2006 දෙසැම්බර් 13 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 387, 579, 595 සහ 808 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස්කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබද්ද පානදුර නගර සභා සීමාව තුල වලාන පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1993.05.30 දිනැති අංක 10494 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නැදැන්මුලවත්ත සහ පැලවත්ත කැබැලි අංක 1ඉ 1ආ, ලොට් 3 සහ ලොට් 4 නමැති, ගොඩනැගිලි, ගස්, වගා, බිම් සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ කැබැලි අංක 1 ලකුණු කල ඉඩම් කොටසට මායිම් උතුරට : නිදමුලවත්තේ වෙන් කළ කොටස සහ දැන් එච්. එච්. චන්ද්‍රසේකරට හිමි අංක 1044 දරන සැලැස්මේ සඳහන් ලොට් 1අ ද, නැගෙනහිරට : අංක 1044 දරන සැලැස්මේ සඳහන් ලොට් 1අ සහ ලොට් 3 (අඩි 20ක් පලල පාර සඳහා වෙන්කිරීම) ද, දකුණට : අංක 1542 දරන සැලැස්මේ සඳහන් මෙම ඉඩමේ කැබැලි අංක 2 සහ බස්නාහිරට : හික්ගහවත්ත *හෙවත්* කහටගහවත්ත *හෙවත්* නිදන්මුලගහවත්ත සහ ඩී. බී. කරුණාරත්නගේ උරුමක්කරුවන් විසින් හිමිකම් කියනු ලබන පැලවත්තේ කොටසක් ද යන මායිම් තුල එකී අංක 10494 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් එකොලහයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 11.50) විශාල, ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/ පත්‍රිරුව එෆ් 387/64හි ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එන්. අබේරත්න විසින් සහතික කරන ලද 1991.02.07 දිනැති අංක 408 දරන ඔප්පුවේ දැක්වෙන අංක 1542 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබැලි අංක 3 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) උඩින් මාර්ග අයිතිය සමග.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

10-646/3

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු පනත මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යෝජනා සම්මුතියේ දැන්වීම

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ අගෝස්තු මස 07 වන දින ඒකමතිකව අනුමත කරන ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ :

"සියල්ලම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. දසනායක විසින් සහතික කරන ලද වර්ෂ 2003ක් වූ සැප්තැම්බර් මස 19 වන දිනැති, අංක 1613 දරන, වර්ෂ 2003ක් වූ සැප්තැම්බර් මස 19 වන දිනැති අංක 1615 දරන සහ වර්ෂ 2004ක් වූ මැයි මස 27 වන දිනැති අංක 1668 දරන උකස් බැඳුම්කර මගින්, කොහුවල, වුඩ්ලන්ඩ් මාවත, අංක 15/1 දරන ස්ථානයේ හෙරලියවලගේ දුමිල් පසීන්ද්‍ර පීරිස් යන අය විසින් ලබා ගන්නා ලද මුල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76හි පිහිටි (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කෙරෙන) කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලැබූ, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද හෙයින් ද,

තව ද, එකී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල ගෙවීමට එකී දුමිල් පසීන්ද්‍ර පීරිස් යන අය පැහැර හරින ලදුව වර්ෂ 2006ක් වූ ජූලි මස 02 වන දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත එකී බැඳුම්කරය මත එකී බැඳුම්කරයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන දෙකකුත් හැත්තෑ එක් දහස් තුන්සිය හැත්තෑවයි සත හතලිස් එකක (රු. 20,71,370.41) මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, එකී බැඳුම්කරය මගින් ඇප ලෙස තැන්පත් කරමින් ලබාගත් පහසුකම මත අය විය යුතු මුළු මුදල වූ එකී රුපියල් මිලියන දෙකකුත් හැත්තෑ එක් දහස් තුන්සිය හැත්තෑවයි ශත හතලිස් එකක (රු. 20,71,370.41) මුදල ද, වර්ෂ 2007ක් වූ ජූලි මස 03 වන දින සිට විකිණීමේ දිනය දක්වා, අයිරා පහසුකම මත 2007.07.02 දිනට හිඟ හිටවා ඇති මුල් මුදල වන රුපියල් දෙලක්ෂ පන්සිය තිස් එකයි පන්සිය හතලිස් දෙකකුත් ශත හැත්තෑ හතක (රු. 2,31,542.77) මුදලක් මත වැල් පොලී පදනම මත එක් වර්ෂයකට 40%ක පොළිය ද කාලවාර ණය මුදල මත වර්ෂ 2007ක් වූ ජූලි මස 02 වන දිනට හිඟ හිටවා ඇති මුල් මුදල වන රුපියල් එක් මිලියන හාරලක්ෂ අසූ නවදහස් හාරසිය අනූවකුත් ශත විසි හයක (රු. 14,89,490.26) මුදල මත වර්ෂයකට සියයට 19.88% බැගින් වූ පොලිය ද ඒ සමඟ අනුගාමී ගාස්තු ද, ප්‍රචාරය කිරීමේ ගාස්තු ද, වැය කරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති මුදල (කිසියම් මුදලක් වේ නම්) මුදල, අයකර ගැනීම සඳහා කොළඹ ට්‍රයඩ් වෙන්දේසිකරුවන්ගේ එන්. ඩී. ඩී. පී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ පරිපාලන සීමාව ඇතුලත කොහුවල කොට්ඨාස අංක 3 කලුබෝවිල නැගෙනහිර ග්‍රාමයේ පිහිටි මිල්ලගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන එහි පිහිටි ගහකොළ, පළතුරු සහ සියලු දෙය ද සමඟ වන වුඩ්ලන්ඩ් මාවතේ වරිපනම් අංක 15/1 දරන බලයලත් මිනින්දෝරු ඩී. යූ. ජේ. නානායක්කාර විසින් සාදන ලද වර්ෂ 2002ක් වූ මැයි මස 26 වන දින දරන අංක 3267 දරන පිඹුරේ ලොට් 2බී වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එකී ලොට් 2බී දරන කැබැල්ලට මායිම්, උතුරට : ලොට් 2ඒ ද, නැගෙනහිරට : අඩි 20 පාර ද (අංක 124 දරන පිඹුරේ ලොට් 6) දකුණට : අංක 124 දරන පිඹුරේ ලොට් 3 ද, බස්නාහිරට : එකී අංක 124 දරන පිඹුරේ ලොට් 1 (වුඩ්ලන්ඩ් මාවත වරිපනම් අංක 17) ද වන ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම තුනක් (අ. 0, රූ. 0, -පර්. 7.3) වන ඉඩම් කොටස. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්ඉරු එම් 2670/48 හි ලියාපදිංචි වී ඇත.

තවද මෙහි පහත දැක්වෙන ඉඩම මතින් සහ ඔස්සේ මාර්ග අයිතිවාසිකම ද සමඟ වේ.

ඉහත කී කලුබෝවිල නැගෙනහිර ග්‍රාමයේ වුඩ්ලන්ඩ් මාවතේ පිහිටි මිල්ලගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. පතිරන විසින් සාදන ලද වර්ෂ 1981 ක් වූ ජූලි මස 24 වන දිනැති අංක 124 දරන පිඹුරේ ලොට් 6 (අඩි 20ක් පළල මාර්ගය සඳහා වන වෙන් කිරීම) වශයෙන් දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එකී ලොට් 6 කැබැල්ලට මායිම්. උතුරට : වුඩ්ලන්ඩ් මාවත ද, නැගෙනහිරට : ලොට් 05 ද, දකුණට : අංක 124 දරන පිඹුරේ ලොට් 04 සහ බස්නාහිරට : එකී අංක 124 දරන පිඹුරේ ලොට් 03 සහ ලොට් 02 ද වන එකී අංක 124 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (අ. 0, -රූ. 0, -පර්. 12) වන ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්ඉරුව එම් 1433/212 හි ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

අංක 76, යෝර්ක් වීදිය,
කොළඹ 01.

10-487

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ මැයි මස 21 වන දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී :

"නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී, මීන් පෙර නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඒ. එස්. ඉලංගකෝන් (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2005.02.14 දින අංක 2398 දරන බැඳුම්කරය සහ වර්ෂ 2006.08.31 දින අංක 4845 පැවරීමේ ඔප්පුව යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 2 දරන ස්ථානයේ පදිංචි අනුරුද්ධ හර්ෂ කුමාර සේනාරත්න (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තවද වර්ෂ 2007 ක් වූ අප්‍රේල් මස 30 වන දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් තුන්ලක්ෂ අසූඑක් දහස් තිස් නවය (රු. 3,81,039) මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද, 1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ

(විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනතින් සංශෝධිත 1990 අංක 04 දරන බැකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් තුන්ලක්ෂ අනූඑක්දහස් තිස්නවයක (රු. 3,81,039) මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2007 ක් වූ මැයි මස 01 වන දින සිට විකිණීම කරන දිනය දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හැත්තෑපන්දහස් නවසිය හැටඑකක (රු. 3,75,961) මුදලක් මත වසරකට සියයට දොලහයි දශම පහක (12.5%) පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 13 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපල සහ පරිශ්‍රය සහ එහි නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද ඇතුළුව බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.".

දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ කලුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලේ කුඹුකේ පත්තුවේ ඔලබඩුව සහ කුඹුකේ ගමෙහි පිහිටි දික්බැද්දේහේන සහ කලුවල යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. විරසිංහ විසින් සාදන ලද 1999.12.21 දින අංක 1720 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කළ ලොට් 168 දරන ඉඩම් කොටසට මායිම් එනම් උතුරට : ලොට් 239 සහ 240 න් ද, නැගෙනහිරට : ලොට් 239, 169 සහ 170 ද දකුණට : ලොට් 169, 170 සහ 229 න් ද සහ බටහිරට : ලොට් 229 සහ 240 න් ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොලහයි දශම දෙකයි හයක (අ. 0, රූ. 0, පර්. 12.26) ඉඩම වන අතර, මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 193/103 හි ලියාපදිංචි වී ඇති අතර, ඒ සමග එකී පිඹුරු අංක 1720 හි ලොට් 229, 238, 248, 13 සහ 266 යන ඉඩම් මතින් මාර්ග අයිතිය ද වේ.

අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

10-538

රුහුණ සංවර්ධන බැංකුව - මාතර නගර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති *විශෙෂ ගැසට්* නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2005.07.12 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

"රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සරෝජිනී වික්‍රමසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 1990.01.25 දිනැති අංක 1791 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මාතර, හිත්තැටිය නැගෙනහිර, කුමාරදාස මාවත, උස්වත්ත, අංක 1/124, පදිංචි කරුණාරත්නගේ තිලකරත්න, යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ එක්ලක්ෂ පහලොස් දහසක (රු. 1,15,000) මුදලක් රුහුණු සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2004.06.10 දින සිට වර්ෂයකට 25% බැගින් රුපියල් එක්ලක්ෂ පහලොස් දහසක (රු. 1,15,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 1791 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.".

උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

01. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර තුළ වැලිවේරියේ පිහිටි - උස්වත්තේ අංක 02, 09 සහ 12 දරන ඒකාබද්ධ ඉඩමට මායිම්, උතුරට : එම ඉඩමේ අංක 17 දරන කැබැල්ල ද, නැගෙනහිරට : පාරට ඉතිරි කරන ලද බිම් තීරයද, දකුණට : මහපාර ද, බස්නාහිරට : එම ඉඩමේ අංක 03, 08, 07, 13 සහ 16 දරන කැබලි ද, යන මායිම් තුළ රූඩ් එකතුත් පර්චස් දහ හතරයි දශම පහක් (අ. 0, රූඩ්. 01, පර්. 14.5) විශාල ඉඩමෙන් එකී අංක 12 සහ 09 ද දරන ඒකාබද්ධ ඉඩමට මායිම්, උතුරට : එම ඉඩමේ අංක 17 දරන කැබැල්ල ද, නැගෙනහිරට : පාරට ඉතිරි කරන ලද බිම් තීරය ද, දකුණට : එම ඉඩමේ අංක 02 දරන කැබැල්ල ද, බස්නාහිරට : එම ඉඩමේ අංක 07, 13 සහ අංක 16 ද දරන කැබලි ද යන මායිම් තුළ පර්චස් තිස් තුනයි දශම හතයි පහක් (අක්. 00, රූ. 00, පර්. 33.75) විශාල ඉඩමෙන් බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන මහතා විසින් වර්ෂ 1996ක් වූ නොවැම්බර් මස 04 වැනි දින මැන සාදන ලද අංක 5363 දරන ප්ලෑනේ ප්‍රකාර නැවතත් බෙදා වෙන්කළ "ඒ" අක්ෂරය දරන කැබැල්ලට මායිම් - උතුරට : මෙම මුල් ඉඩමේ අංක 17 දරන කැබැල්ලද, නැගෙනහිරට : පාරට ඉතිරි කරන ලද බිම් තීරය ද, දකුණට : එකී අංක 5363 දරන ප්ලෑනේ ප්‍රකාර බෙදා වෙන්කළ මෙම ඉඩමේ "බී" අක්ෂරය දරන කැබැල්ල ද, බස්නාහිරට : මෙම මුල් ඉඩමේ අංක 13 සහ 16 ද දරන කැබැලිද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 14.50) විශාල ඉඩමේ (මෙහි තැගි ලැබුම්කාරියගේ ස්වාමිපුරුෂයා විසින් සාදවා ඇති 124/2 දරන ගෙය ඔහුට අතහැර) සියළු ගහකොළ, පළතුරු සහිත බිමද,

02. එකී වැලිවේරියේ පිහිටි - උස්වත්තේ අංක 02, 09 හ 12 ද, දරන ඒකාබද්ධ කැබලි වලින් එකී අංක 12 සහ 09 ද දරන ඒකාබද්ධ කැබලි දෙකෙන් එකී අංක 5363 දරන ප්ලෑනේ ප්‍රකාර නැවතත් බෙදා වෙන්කළ "බී" අක්ෂරය දරන කැබැල්ල ද, උතුරට : මෙම ඉඩමේ "ඒ" අක්ෂරය දරන කැබැල්ල ද, දකුණට : මෙම මුල් ඉඩමේ ඉතිරි අංක 09 දරන කැබැල්ල ද, බස්නාහිරට : වරිපනම් අංක 126/16 දරන මෙම මුල් ඉඩමේ අංක 13 දරන කැබැල්ලද යන මායිම් තුළ පිහිටි පර්චස් දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 30.0) ක් විශාල ත්‍රිකෝණාකාර ඉඩමේ සියළු ගහකොළ, පළතුරු සමග බිමද, වෙත්.

මෙම දේපල ඒ417/196/197/27/73 යටතේ 2000.01.26 දින මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සභාපති,
එස්. ජේ. රත්නායක.

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන. මාතර.

10-641

මහජන බැංකුව - මහරගම ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004 අගෝස්තු මස 25 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද 2000 ඔක්තෝබර් මස 03 වැනි දින අංක 4098 සහ 2003 නොවැම්බර් මස 12 වැනි දින අංක 5240 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම මල්ලවආරච්චිගේ නිමල්සිරි ඉන්ද්‍රරත්න සහ කුසුම් ප්‍රියානි පත්බේරිය සහ තනුජා බුද්ධිකා මල්ලවආරච්චි විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී බැඳුම්කර මත රුපියල් දහනව ලක්ෂ හතලිස් දහසක (රු. 19,40,000) මුදලක් සහ රුපියල් නවලක්ෂ හතලිස් හතර දහසක් (රු. 9,44,000) සහ රුපියල් දශ ලක්ෂයක (රු. 10,00,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් දහනව ලක්ෂ හතලිස් දහසක (රු. 19,40,000) එකී මුදල ද රුපියල් නවලක්ෂ හතලිස් හතර දහසක (රු. 9,44,000) එකී මුදල ද රුපියල් දශ ලක්ෂයක (රු. 10,00,000) එකී මුදල ද 2004 පෙබරවාරි මස 17 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දහනව ලක්ෂ හතලිස් දහසක (රු. 19,40,000) මුදලක් මත වර්ෂයකට සියයට විසි එකයි දශම පහ (21.5%) බැගින් තවදුරටත් වූ පොළිය ද, 2004 පෙබරවාරි මස 27 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් නවලක්ෂ හතලිස් හතර දහසක (රු. 9,44,000) මුදලක් මත වර්ෂයකට සියයට දහනවයයි දශම දෙකයි පහ (19.25%) බැගින් තවදුරටත් වූ පොළිය ද 2004 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දස ලක්ෂයක (රු. 1,000,000) මුදලක් මත වර්ෂයකට සියයට දහනවයයි දශම දෙකයි පහ (19.25%) බැගින් තව දුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයවිය යුතුව මුදල් ද එදින තෙක් කරනු ලැබූ ඇති ගෙවීම් (කිසිවක වේ නම්) අඩු කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා අංක 4098 හා 5240 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සීමාව තුළ රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, තලගල පිහිටියා වූ ද තලගල එස්ටේට් යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සාදන ලද අංක 170 හා 1991 ඔක්තෝබර් මස 6 සහ 8 දින දරන පිඹුරේ ලොට් B1 ලෙස ලකුණුකොට නිරූපණය කර ඇත්තා වූ ද උතුරට : එච්. නාමදාස සහ තවත් අයට සමරනායක සහ එච්. ඒ. පෙරේරා සහ තවත් අයට අයත් තලගල එස්ටේට් හි කොටස ද, නැගෙනහිරට : වතු පාර සහ ලොට් B2 දරන කොටස ද, දකුණට : ලොට් B2 කොටස සහ වයි. ආර්. පියසේන සහ ජී. ඩී. රත්නවතී හා තවත් අයට අයිති තලගල එස්ටේට් හි කොටස ද, බස්නාහිරට : ජී. ඩී. රත්නාවතී සහ තවත් අයට අයිති තලගල එස්ටේට්හි කොටසස් (අඩි 15ක් පළල) පාර එච්. නාමදාස හා තවත් අයට සහ සමරනායකට අයිති තලගල එස්ටේට් හි කොටස ද මායිම් වන්නා වූ ද එකී අංක 170 දරන පිඹුරුට අනුව අක්කර පහයි, රූඩ් තුනයි, පර්චස් පහයි දශම අටක් (අ. 5, රූ. 3, පර්. 5.8) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුලු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත් ය. එකී අංක 170 දරන පිඹුරේ දැක්වෙන ලොට් B2 (පාර සඳහා වෙන් කිරීම) උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ.

හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි C 117/288 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
(බටහිර කලාප - II)

මහජන බැංකුව,
කලාප කාර්යාලය,
(බටහිර කලාප II),
අංක 177, හයිලෙවල් පාර,
නුගේගොඩ.

10-660

මහජන බැංකුව - හම්බන්තොට ශාඛාව

1986 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞ් වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞ් වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ඩී. කුමුදිනී මිය විසින් සහතික කරන ලද 2005.08.31 දිනැති අංක 1408 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, එදිරිවීර පටබැඳිගේ විමලසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂ හතලිස් පන්දහස් හතලිස් නමයයි ශත අසූහයක් (රු. 4,45,049.86) සහ රුපියල් පන්ලක්ෂය (රු. 5,00,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.03.20 දින සිට වර්ෂයකට 19.5% බැගින් රුපියල් හාරලක්ෂ හතලිස් පන්දහස් හතලිස් නමයයි ශත අසූහයක් (රු. 4,45,049.86) මුදල සහ 2007.01.16 දින සිට වර්ෂයකට 19.5% බැගින් රුපියල් පන්ලක්ෂයක (රු. 5,00,000) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29L වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුවී එකී රුපියල් හාරලක්ෂ හතලිස් පන්දහස් හතලිස් නමයයි ශත අසූහයක් (රු. 4,45,049.86) සහ රුපියල් පන්ලක්ෂයක (රු. 5,00,000) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් ඉහත කී අංක 1408 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, මහබෝලාන ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ, මහබෝලානේ පිහිටි මහබෝලාන කැලේ නමැති ඉඩමට සර්වේ ජනරාල්වරයා විසින් සහතික කරන ලද අංක 567 දරන අවසාන ගම් පිඹුරේ අංක 4CQ10 දරන කැබැල්ලට එම පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : එම පිඹුරේම අංක 4CQ11 දරන කැබැල්ල ද, නැගෙනහිරට : එම පිඹුරේම 4CQ22 දරන කැබැල්ල ද, දකුණට : එම පිඹුරේම 4CQ55 සහ 4CQ22 දරන

කැබැල්ල ද, බස්නාහිරට : එම පිඹුරේම 4CQ55 දරන කැබැල්ල ද යන සතර මායිම් තුළ පිහිටි අක්කර බිංදුවයි, රූඩ් එකයි, පර්චස් විසිඅටක් (අ. 0, රූ. 1, පර්. 28) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි ආදී දේද වේ.

මෙම ඉඩම හම්බන්තොට දිස්ත්‍රික් ඉඩම් කාර්යාලයේ LDO/1/111B අංක දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත. මෙම ඉඩම සමග ගොඩනැගිල්ලට සවි කරන ලද පහත සඳහන් යන්ත්‍රසූත්‍ර ද ඇතුළත් ය.

01. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත - එලිවේටර් - 02
02. චීනයේ නිෂ්පාදිත - කම්බිනේෂන් - 02
03. චීනයේ නිෂ්පාදිත - පොලිෂර් - 01
04. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත - සෙපරේටර් - 01
05. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත - ස්විච්බෝඩ් - 01
06. චීනයේ නිෂ්පාදිත - මෝටර් - 02

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
හම්බන්තොට.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 7ඒ, ටවර්හිල් මාවත,
හම්බන්තොට.

10-663

මහජන බැංකුව - මාතර ධර්මපාල මාවත ශාඛාව

1986 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.07.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රූබසිංහ විසින් සහතික කරන ලද 2006.03.31 දිනැති 3242 සහ මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. රණසිංහ විසින් සහතික කරන ලද 1999.01.08 දිනැති 4322 ද, 1999.01.08 දිනැති 4323 දරන උකස්කර ප්‍රකාර ගෙවීම් ජාසිං පතිරණගේ රන්ජිත් බන්දුල සහ ජාසිං පතිරණගේ සරත් අමරනන්ද යන අය විසින් පැහැර හැර ඇති බැවින්, එකී උකස්කර 3242, 4322 සහ 4323 යටතේ රුපියල් දහතුන් ලක්ෂ විසිහතර දහස් නවසිය අනූනවයක (රු. 13,24,999) මුදලක් සහ රුපියල් පහළොස් ලක්ෂ අනූදෙදහස් පන්සියයක (රු. 15,92,500) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2004.07.01 දින සිට වර්ෂයකට සියයට විසිඑකයි දශම පහ (21.5%) බැගින් රුපියල් දහතුන් ලක්ෂ විසිහතරදහස් නවසිය අනූනවයක (රු. 13,24,999) මුදල සහ 2004.07.01 දින සිට වර්ෂයකට සියයට දොළහ (12%) බැගින් රුපියල් පහළොස් ලක්ෂ අනූදෙදහස් පන්සියයක (රු. 15,92,500) මුදල සඳහා වෙන්දෙසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් දහතුන් ලක්ෂ විසිහතර දහස් නවසිය අනූනවයක (රු. 13,24,999) මුදල සහ රුපියල් පහළොස් ලක්ෂ අනූදෙදහස් පන්සියයක (රු. 15,92,500) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 3242, 4322 සහ 4323 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරි ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තරය

01. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ, බැමිණියන්විල පිහිටි පලුගහහේන නැමැති 1996.06.22 දිනැති එස්. රංචාගොඩ බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 4388 දරන පිඹුරේ අංක 01 යනුවෙන් පිළිබිඹු කර ඇති ඉඩම් කැබැල්ලට එම පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : එස්. පී. ජුලිනෝනාට අයිති ඉඩම ද, දකුණට : එම්. එම්. ලිලිනෝනාට අයිති ඉඩම ද, බස්නාහිරට : නෝනාගම සිට ඇඹිලිපිටියට යන ප්‍රධාන පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දහයක් (අ. 0, රූ. 1, පර්. 10) විශාල ඉඩම සහ එහි තුළ තිබෙන වැව්ලි, ගොඩනැගිලි යනාදී සියළු දැයද වේ.

මෙම ඉඩම හම්බන්තොට දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හම්/21/1532/96ඒ යටතේ ලියාපදිංචි කර ඇත.

02. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ, බැමිණියන්විල පිහිටි 1997.11.30 දින ඊ. එම්. ප්‍රේමසිරි බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද 971108 දරන පිඹුරේ පිළිබිඹු කර ඇති අංක 01 දරන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : අතුරු පාර ද, නැගෙනහිරට : එල්. පී. මාලනි, එස්. ජේ. පියසේන යන අයට අයිති ඉඩම ද, දකුණට : එම්. එම්. ලිලිනෝනාගේ ඉඩම ද, බස්නාහිරට : රංජිත් බන්දුලගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් තිහක් (අ. 0, රූ, 1, පර්. 30) වශයෙන් සඳහන් වී ඇතත් නිවැරදිව රූඩ් එකයි, පර්චස් එකොළහක් (අ. 0, රූ, 1, පර්. 11) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි යනාදි සියළු දැයද වේ.

මෙම ඉඩම හම්බන්තොට දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හම්/2/ප්‍ර/27574 යටතේ ලියාපදිංචි කර ඇත.

03. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙනිපිටියේ පිහිටි ඉපිටම්ගෙල්ගෙවත්ත යන ඉඩමේ කැබලි අංක "ඒ" ට 1947.11.20 දින ඒ. එච්. පෙල්සිංගර් බලයලත් මිනින්දෝරු මහතා විසින් සහතික කරන ලද පිඹුරු අංක 1529බී වලින් බෙදා වෙන් කරනලද කැබලි අංක 01ට මායිම් උතුරට : තනිගහවත්ත සහ මීගෙල්ගෙවත්ත ගොඩැල්ල ද, නැගෙනහිරට : ඉපිටම්ගෙල්ගෙවත්ත "බී" අක්ෂරය දරන කැබැල්ල සහ මෙම ඉඩමේ බෙදා වෙන් කළ අංක 02 දරන කැබැල්ල ද, දකුණට : පාර ද, බස්නාහිරට : තනිගහවත්ත ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් විසිතුනයි දශම එකක් (අ. 0, රූ. 1, පර්. 23.1) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි යනාදී සියළු දැයද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඩී 974/269 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 38/1ඒ, පිට්ටනිය පාර,
මාතර.

10-661

මහජන බැංකුව - නගර මධ්‍ය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2006.12.22 දින පැවැති ඔවුන්ගේ රැස්වීමේදී ඒකමතිකව සම්මත කර ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. බී. එම්. ගුණරත්න මහතා විසින් සහතික කරන ලද අංක 377 සහ 2004.12.23 වැනි දින දරන උකස් බැඳුම්කරය මත නියමිත ගෙවීම් වික්‍රමසිංහ ආරච්චිගේ නිමල් වික්‍රමසිංහ විසින් පැහැර හැර ඇති බැවින් අංක 377 දරන උකස්කර බැඳුම්කරය මත රුපියල් එකොලොස් ලක්ෂ නවදහස් නවසිය හැටහතරයි ශත විසි හයක් (රු. 11,19,964.26) වන මුදල මහජන බැංකුවට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. රුපියල් එකොලොස් ලක්ෂ නව දහස් නවසිය හැටහතරයි ශත විසි හයක් (රු. 11,19,964.24) වන එකී මුදල සහ රුපියල් එකොලොස් ලක්ෂ නව දහස් නවසිය හැටහතරයි ශත විසි හයක් (රු. 11,19,964.26) වන මුදල මත 2006.01.23 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 15.50% ක අනුප්‍රමාණයට තවදුරටත් පොලිය ද, වෙන්දේසි පිරිවැය හා වෙනත් ගාස්තු ද, එදින තෙක් ලැබී ඇති ගෙවීම් (කිසිවෙක් වේනම්) අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා එකී අංක 377 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, අංක 37 දරන කොල්ලුපිටිය ඡන්ද කොට්ඨාශය ඇතුළත නෙල්සන් පටුමගෙහි පිහිටි දැනට නෙල්සන් පටුමග වරිපනම් අංක 39/54 දරන සර්වේයර් ජෙනරාල්වරයා විසින් සාදන ලද අංක Co. 883 (CH/0/964) සහ 1982.11.10 දින දරන පිඹුරේ නිරූපණය කර ඇති ලොට් 76 වශයෙන් ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කට්ටිය වන එකී ලොට් 76ට මායිම් උතුරට : එකී පිඹුරේ ලොට් 75 ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 49 සහ පාර ද, දකුණට : එකී පිඹුරේ ලොට් 90 සහ ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 31 සහ පාර මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතයි හතක් (හෙක්. 0.0077) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා අන් සියලු දේත් ය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 684/138හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් අංක 5883 දරන පිඹුරේ නිරූපණය කර ඇති පහත දැක්වෙන ඉඩම් කට්ටි මත පොදු අයිතීන් සමගය.

ලොට් අංකය	*විස්තරය*	*විශාලත්වය*
4	පාර	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි තුනයි අටයි (හෙක්. 0.0038)
5	ගෙපත්-ගොඩනැගිලි 2, (කපරාරුකළ) පොදු වැසිකිලිය, කොන්ක්‍රීට් වහළ, ජලනල සහිතයි	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි හයයි නවය (හෙක්. 0.0169)
10	ගෙපත්-පොදු වැසිකිලිය-ජලනල 2යි	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි හයයි නවය (හෙ. 0.0169)
11	පාර	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතයි හතර (හෙ. 0.0074)
16	පාර	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතරයි දෙක (හෙ. 0.0042)
17	පාර	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හයයි දෙක (හෙ. 0.0062)
31	පාර	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හයයි හතරයි හය (හෙ. 0.0646)
38	පාර	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි හතරයි තුන (හෙ. 0.0143)
49	පාර	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි එකයි හත (හෙ. 0.0117)
59	ගෙපත්-පොදු වැසිකිලිය-(කපරාරු කළ) ස්ථිර ගොඩනැගිල්ල මත, කොන්ක්‍රීට් වහල සහිතයි	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතරයි නවය (හෙ. 0.0049)
61	පාර	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි එකයි අට (හෙ. 0.0018)
89	ගෙපත්-පොදු වැසිකිලිය-(කපරාරු කළ) ස්ථිර ගොඩනැගිල්ල මත, කොන්ක්‍රීට් වහල සහිතයි	හෙක්ටායර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි එකයි හත (හෙ. 0.217)
90	ගෙපත්-වැව්ලි නැත	හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි අටයි දෙක (හෙ. 0.0082)

මෑතදී කළ මැනීමක් අනුව ඉහත කී ඉඩම පහත දැක්වෙ පරිදි විස්තර කෙරේ :

ඉහත සඳහන් පරිදි ඡන්ද කොට්ඨාසය අංක 37 දරන කොල්ලුපිටියේ, නෙල්සන් පටුමග ඔබ්බට පිහිටි නෙල්සන් පටුමගේ දැනට වරිපනම් අංක 39/54 දරන සර්වේයර් ජෙනරාල්වරයා විසින් සෑබෑ බවට සහතික කරන ලද P.P.Co. 5883 දරන පිඹුරෙහි ලොට් 76 වශයෙන් නිරූපණය කර ඇති ඉඩමේ නැවත මැණීමක් වන බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්. කාවල්හෝ විසින් සාදන අංක 4090 සහ 2004.03.26 දින දරන පිඹුරේ නිරූපණය කර ඇති ලොට් "ඒ" වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ මුළු ඉඩම් කට්ටිය වන උතුරට : නෙල්සන් පටුමග වරිපනම් අංක 39/53 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : පාර (P.P.Co.

5883හි ලොට් 49) හා දකුණට : P.P.Co. 5883හි ලොට් 90 හා බස්නාහිරට : පාර (P.P.Co. 5883හි ලොට් 31) මායිම් වූ පර්චස් තුනයි දශම බිංදුවයි හතරක් (අ. 0, රූ. 0. පර්. 3.04) (හෙක්. 0.0077) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි හා අන් සියලු දේත්ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාපය - 01.

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

10-664

මහජන බැංකුව - වත්තල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.01.20 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2001.04.04 දිනැති අංක 5839 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් අලගියදුරගේ නිමල් ලීනස් ජෝෂප් ප්‍රනාන්දු සහ වාමනී මල්කාන්ති ප්‍රනාන්දු යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ හැත්තෑපන්දහස (රු. 3,75,000) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2004.04.01 වැනි දින සිට වර්ෂයකට 26% බැගින් රුපියල් තුන්ලක්ෂ හැත්තෑපන්දහස (රු. 3,75,000)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ හැත්තෑපන්දහස (රු. 3,75,000) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 5839 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

උකස් කරන ලද දේපළ පිලිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ හැඳල උප කාර්යාල සීමාව තුළ හේකිත්ත ගම පිහිටි වරිපනම් අංක 77/10 දරන ගොරකගහවත්ත, හික්ගහවත්ත සහ කජුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සිරි ඩී. ලියනසූරිය විසින් 1972.11.15 වැනි දින මැන සකස් කළ අංක 680බී දරන පිඹුරේ ලොට් අංක ඒ2 දරන කොටසට මායිම් උතුරට : ජෝෂප් පීරිස්ගේ ඉඩම ද, නැගෙනහිරට : සී. එෆ්. බී. ඇන්තනීගේ ඉඩම ද, දකුණට : ලොට් ඒ 5 (අඩි 10 පාරක් සඳහා වෙන් කළ) ද, බස්නාහිරට : ලොට් ඒ1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20)ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදි සියලු දේත් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 573/242හි ලියාපදිංචි කර ඇත.

තව ද, පහත සඳහන් ඉඩම්වල මාර්ග අයිතීන් ද සමඟ වේ.

1. ඉහත කී පිඹුරු අංක 680බී හි සඳහන් ලොට් ඒ5, දරන කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක බී 573/234හි ලියාපදිංචි කර ඇත.

2. එකී ගොරකගහවත්ත, හික්කගහවත්ත, කජුගහවත්ත යන ඉඩමට සිරි ඩී. ලියනසූරිය මානක තැන විසින් සාදන ලද අංක 461 දරන 1971.09.19 දින දරන පිඹුරේ සඳහන් ලොට් ඒ3බී දරන කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 582/281 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

3. එකී ගොරකගහවත්ත, හික්ගහවත්ත, කජුගහවත්ත යන ඉඩමට ඩී. ඒ. මෙන්ඩිස් මානක තැන විසින් සාදන ලද අංක 1060 දරන 1966.10.14 දින දරන පිඹුරේ සඳහන් ලොට් සී දරන කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 551/109 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

10-662

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.